මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය

# මතුගම අධ්‍යාපන කලාපය

## පෙර'ඹරට සවියක් ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන

| සිංහල භාෂාව හා සාහිත්‍යය I | 11 ශ්‍රේණිය | කාලය : පැය 01 යි |
|---|---|---|

- සැලකිය යුතුයි.
  - ❖ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මේ ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
  - ❖ අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති (1), (2), (3), (4) උත්තර වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.

- අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවලට එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

01. මඩේ හිටවපු ඉන්න වගේ වැඩ කිරීම සමහරුන්ගේ ප්‍රතිපත්තියයි.
    (1) ස්ථිර ප්‍රතිපත්තියක් නැතිවීම.
    (2) කිසිම ප්‍රයෝජනයක් නොලැබීම.
    (3) අවදානම් වැඩක් අනුන් ලවා
    (4) කොතැන ගියත් ගතිගුණ වෙනස් නොවීම.

02. ආවාට ගියාට වැඩ කිරීම දියුණුවට බාධාවකි.
    (1) ඉක්මනින් ආපසු යෑම. (2) උවමනාවකින් තොරව වැඩ කිරීම.
    (3) අනතුරක සේයා පහළ වීම. (4) නිෂ්ඵල වැඩක් කිරීම.

03. එම දේශනයේ දී රටේ සමහර ප්‍රදේශවල කැලෑවේ නීතිය රජ කරන බව ප්‍රකාශ විය.
    (1) බලවතා දුබලයා පෙලීම.
    (2) අනවසර පදිංචිය.
    (3) නීතිය නිසි ලෙස ක්‍රියාත්මක නොවන බව.
    (4) වන සතුන් බහුල ව විනාශ වීම.

- අංක 04 සිට 06 දක්වා ප්‍රශ්නවලට වඩාත් සුදුසු පදය තෝරන්න.

04. විශ්ව විද්‍යාල අධ්‍යාපනය හදාරන විද්‍යාර්ථීහු නිරන්තරයෙන් පොත පත ........................... කළහ.
    (1) විමර්ශනය (2) පරිශීලනය
    (3) නිරීක්ෂණය (4) විචාරය

05. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා නිදහස් අධ්‍යාපනයේ ........................... විය.
    (1) ආරම්භකයා (2) නිර්මාපකයා
    (3) පුරෝගාමියා (4) ආදිතමයා

06. නවකතාව ලෝකයේ ප්‍රචලිතව ඇති ........................... සාහිත්‍යාංගයකි.
    (1) මධ්‍යතන (2) පුරාතන
    (3) අද්‍යතන (4) චිතරන්තන

07. අකාරාදී පිළිවෙළට යෙදී ඇති පද පේළිය තෝරන්න.
    (1) කන්දෙපොළ, කඩුගන්නාව, කඩවත, කහල්ල, කටුගස්තොට
    (2) මාරස්සන, මාරවිල, මාදිවෙල, මාලබේ, මාස්පොත
    (3) නයිනමඩම, නයිවල, නාකියාදෙණිය, නාරම්මල, නිකවැරටිය
    (4) දිවුලපිටිය, දිගරොල්ල, දිගම්පතන, දිගන, දියබාව

08. නිවැරදි ලෙස අක්ෂර වින්‍යාසය යෙදී නැති පද පේළිය තෝරන්න.

(1) අත්‍යවශ්‍ය, දූරකථනය, ප්‍රාසංගික, ඊද්මානුකූල

(2) ව්‍යංග්‍යාර්ථය, ප්‍රත්‍යාර්ථ, තුෂ්ණිම්භූත, කනිෂ්ට

(3) පරිභෝජන, පොලඹවන, නැළවීම, කනගාටුව

(4) විද්‍යුතය, ධූරය, චෛත්‍යය, නිශ්ශබ්ද

09. කෙටි ඇදය, දිගු පාපිල්ල, ගයනුකිත්ත හා ඉස්පිල්ල යන පිල්ලම් පිළිවෙළින් පළමු අකුරෙහි යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) රුවල, කුඩය, නෞකාව, මිසරය (2) රැකවල, සූදානම, පෘථග්ජන, විස්මය

(3) ඇතා, මුගටියා, ව්‍යාඝ්‍රයා, ගිරවා (4) කැත්ත, රූමත්, මෞර්ය, විවාහය

10. තද්ධිත පද දෙකක් හා කෘදන්ත පද දෙකක් යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) සැරසිලි, සිඟිති, සිඟමන්, සෙවිලි (2) නටන, ගැයුම්, බලන, සිල්වත්

(3) නැටුම, ශෛලමය, ප්‍රසන්න, විද්‍යාඥ (4) මොළකැටි, නැටිලි, කීර්තිමත්, බැලුම

11. අන්තඃස්ථාක්ෂරයෙන් නොයෙදුණු වචනයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) සක්වළ, තීර්ථක, අනුවණ, නෙත්කලු (2) පුරහඳ, රුපුනොද, පුහුණුව, කුසලාන

(3) බෙලහීන, පිළිවෙත, කෙළිබඩු, ගින්න(4) චේතනාව, උකටලී, පිළිමය, සුරඟන

12. එක් එක් පද පේළියේ සමානාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

(1) වැලි - පුලින, නුවණැති - නියවත්, ප්‍රගතිය - ප්‍රගමනය, දුනු - සැවි

(2) ඝන - බොල්, ලොල් - පුලුබ්බ, ඇලුම් - අලංකෘත, අහංකාරය - ගර්වය

(3) කුරවීක - කොවුල්, බරාඳය - ආලින්දය, ලග්න - ආසක්ත, කුටිල - වංක

(4) කඳුළු - අශ්‍රු, මොහොත - නිමේෂය, වැසුණු - පිළිසන්, සක්දෙව් සුරරද

13. විරුද්ධාර්ථ පද යුගලය නොවන්නේ කුමක් ද?

(1) සැනසිල්ල - කරදරය (2) අවමන් - බුහුමන්

(3) ආයත - නිර්යාත (4) අනවශේෂ නිරවශේෂ

14. මුලින් දී ඇති පදයේ නිවැරදි විසන්ධිය දැක්වෙන වරණය කුමක් ද?

(1) හරිතාගාර - හරිත + ආගාර (2) අල්ලස් - අල් + අස්

(3) රුක්කත්තන - රුක් + කත්නන (4) මාර්ගෝපදේශ - මාර්ගෝප + දේශ

15. මුලින් දී ඇති ව්‍යාකරණ වර්ගයට අයත් පද පමණක් යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) නිත්‍ය බහුවචන - කෙනෙක්, ඇතමෙක්, අයෙක්, සමහරු

(2) අසම්භාව්‍ය ක්‍රියා - කියද්දී, ආවොත්, සැරදේ, කරත

(3) නිපාත - දක්වා, විතර, මිස, තරම්

(4) ප්‍රයෝජ්‍ය ක්‍රියා - ලියවයි, බලවයි, නටවයි, සාදවයි

16. උක්ත නාම පද දෙකක් සහ අනුක්ත නාම පද දෙකක් යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) කම්කරුවා, පාලකයන්, ගොවීහු, ගෙවිලියක්

(2) සිංහයන්, ඇත්තු, බළල්ලු, එළදෙන්නු

(3) තාපසයකු, බැමිණියක්, කුමාරිකාවක, ඇමතිවරයෙක්

(4) ගුරුවරුන්, ශිෂ්‍යාවක්, ගුරුවරියක, ශිෂ්‍යයකු

17. දී ඇති අක්ෂර ගැළපීමෙන් සෑදෙන නිවැරදි ග්‍රාම නාමය දැක්වෙන වරණය කුමක් ද?

(1) බකෙන්ඟුතහ (2) යණිදැලගර

(3) රාමොලගස (4) රදල්වුදෙ

18. පහත (අ), (ආ) කොටස් යටතේ දැක්වෙන සමාස වර්ග හා අදාළ නිදසුන් වඩාත් නිවැරදි ලෙස ගැළපෙන වරණය කුමක්ද?

| | | | | | |
|---|---|---|---|---|---|
| ᵖ | - | විභක්ති සමාසය | ʑ | - | මුවතඹර, තුන්බිය, සේනකපඩි |
| ඊ | - | විශේෂණ සමාසය | ත | - | අනවශ්‍ය, අකුසල්, දුසිරිත් |
| ක | - | අන්‍යාර්ථ සමාසය | ඨ | - | ජනප්‍රිය, මුනිපුද, සරාසඳ |
| a | - | අව්‍යය සමාසය | ɣ | - | තිනෙත්, සියපත්, තාරපති |

(1) ᵖɣ (2) කත (3) aඨ (4) ඊʑ

19. ගඟ ගැලුවොත් හෙට උදේට කොහොමද ඉස්කෝලේ යන්නේ. මෙහි ගැලුවොත් යන්නෙහි ක්‍රියා වර්ගය වන්නේ,

(1) අසම්භාව්‍ය ක්‍රියා (2) මිශ්‍ර ක්‍රියා

(3) පූර්ව ක්‍රියා (4) ආශිර්වාද ක්‍රියා

20. ''වැජඹෙයි'' යන ක්‍රියා පදයේ අතීත කාල, මධ්‍යම පුරුෂ, ඒක වචනය පහත සඳහන් වරණ අතුරින් තෝරන්න.

(1) වැජඹුණේ ය (2) වැජඹුණොහු

(3) වැජඹෙන්නෙහි (4) වැජඹුණෙහි

- (21) සහ (22) ප්‍රශ්නවල මුලින් දී ඇති ප්‍රකාශයේ අදහසට ගැළපෙන ප්‍රස්තාව පිරුළ දී ඇති වරණ අතුරින් තෝරන්න.

21. කෑදරකම නිසා දැන දැන ම අමාරුවේ වැටීම.

(1) මෝල් ගස් ගිලපු පිඹුරා වගේ (2) කටුස්සන් කාපු බැළලි වගේ

(3) උඟරන්ට බත් දුටුවම ඔක්කාරෙ වගේ (4) ඇටි කෙහෙල් කාපු උගුඩුවා වගේ

22. ඉතා අඩු ඉඩක ඉතා විශාල කටයුත්තක් සිදු වීම.

(1) ඉඳි වල්ල ගලේ ගැහුවා වගේ

(2) ඉත්තෑවගේ ගෙට කබල්ලෑවා රිංගුවා වගේ

(3) ලබු ගෙඩියේ කංකාරිය වගේ

(4) දිය කොරහේ කිඹුලන් දැක්කා වගේ

23. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් ළං වන කාර්යයන් සමඟ බැඳී නොපවත්නා පද පේළිය වන්නේ,

(1) සතුට, දුක, වේදනාව, චෝදනාව (2) අහස, වැස්ස, වලාකුළ, ජලය

(3) බිත්ති, දොර, තීන්ත, ජනේලය (4) විල, මැඩියා, නෙලුම් මල, මාළු

24. මුලින් දී ඇති එක් එක් පොදු ව්‍යවහාරයේ අර්ථය නොදෙන ප්‍රාදේශික ව්‍යවහාරයක් ඇතුළත් පද පේළිය තෝරන්න.

(1) සීයා - කිරි අත්තා, අත්තප්පා, කිරි අප්පා, ලොකු අත්තා

(2) පියාගේ වැඩිමහල් සහෝදරයා - ලොකු අප්පච්චි, ලොකු තාත්තා, මහප්පා, බක්කප්පච්චි

(3) මවගේ වැඩිමහල් සහෝදරිය - බක්කම්මා, ලොකු අම්මා, මහම්මා, කුඩම්මා

(4) පියාගේ බාල සහෝදරයා - බාප්පා, බාප්පොච්චි, කුඩප්පා, කුඩප්පච්චි

- (25) සිට (28) තෙක් ප්‍රශ්නවල ඉරි ඇඳි කොටස්වල අර්ථය නිවැරදි ව දක්වා ඇති වරණය තෝරන්න.

25. ''... තමන් වහන්සේ බුදුන් කෙරෙහි <u>අවිනෂ්ට ව</u> කළා වූ මහ පෙම් වතුරු රඳවා ගත නොහී ...''

(1) අප්‍රසිද්ධ වූ (2) විවිධාකාර වූ

(3) අසමාන වූ (4) විනාශ නොවූ

26. ''... සන් දි දි කෙළනා රන් <u>තිත් වෙහෙල් කැල</u> දැක ...'''

(1) තිත් මුවන් සමූහයා (2) තිත් කොවුල් සමූහයා

(3) තිත් මසුන් සමූහයා (4) තිත් වඳුරු සමූහයා

27. ''තා දැන් <u>ෂෂ්ටි පුරුෂ</u> මාන වූ වළකින් ගොඩනැඟීම්''

(1) පුෂ්ටිමත් පුරුෂයන්ගේ (2) වැඩිහිටි පුරුෂයන්ගේ

(3) පුරුෂයන් සැට දෙනෙකුගේ (4) හයක් වූ පුරුෂයන්ගේ

28. ''කන්සෙට පාරක් දෙමැයි කියන්නී
මන් බොල තට දර දිය ද අදින්නී''

(1) කම්මුලට (2) ශීර්ෂයට (3) පිට දිගට (4) කකුලට

29. ''වටපිටාව හැම තිස්සේ ම පිරිසිදු ව තියා ගන්නවා නම් මදුරුවෝ බෝ වෙන්නේ නෑ'' යන වාක්‍ය ලිඛිත ව්‍යවහාරයට හැර වූ විට වඩාත් නිවැරදි වාක්‍යය ඇති වරණය තෝරන්න.

(1) වටපිටාව හැම විටෙකම පිරිසිදුව තියා ගන්නවා නම් මදුරුවෝ බෝ වන්නේ නැත.

(2) පරිසරය සෑම වේලාවේ ම පිරිසිදුව තබා ගන්නේ නම් මදුරුවෝ බෝ වෙන්නේ නැත.

(3) වටපිටාව හැම විටෙකම පිරිසිදුව තබා ගන්නවා නම් මදුරුවන් බෝ වෙන්නේ නැහැ.

(4) පරිසරය සෑම විටෙකම පිරිසිදුව තබා ගන්නේ නම් මදුරුවන් බෝ වන්නේ නැත.

30. ᵖ - ''පෙත්සම් ගහල බැරිම තැන තමයි මම මෙහෙම දෙයක් ගැන හිතුවෙ''

ඊ - ''මේ මිනිස්සු තමයි මහ පොළොවේ නියම පුත්තු''

ක - ''හොඳමයි තමුන්නාන්සෙ තියනව නම් මම පොරොන්දු වෙන්නම්''

 බ - ''මම දැන් නිදහස් ගෑනියෙන් නෙමෙයි හාමුදුරුවනේ''

ඉහත ප්‍රකාශ ඇතුළත් පාඩම් අනුපිළිවෙළ කුමක් ද?

ඍ - මං තනන්නෝ ත - තොරොක්කෝව

ඨ - පුවත්පත් විශේෂාංග ලිපි ය - වතුර මල

(1) යඨඍත (2) ඨඍයත (3) ඍයතඨ (4) තඨයඍ

- අංක (31) සිට (34) තෙක් එක් එක් ප්‍රශ්නයේ ඇතුළත් වාක්‍ය අතුරින් ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

31. (1) අම්මාත් නංගීත් පෙරහැර බැලීමට නුවර ගියා ය.

(2) අද සමාජයේ බොහෝ දෙනෙකු අයුක්තියට එරෙහි නොවෙති.

(3) අපි ලක් මවගේ දරුවෝ ය.

(4) පරෙවි සන්දේශය ලියුවේ ශ්‍රී රාහුල හිමියෝ ය.

32. (1) සිසු සිසුවියෝ ත්‍යාග ලබා ගත්තේ විදුහල්පතිතුමා අතිනි.

(2) ගුරුවරු විසින් දරුවන් යහමඟ යැවෙති.

(3) හෙතෙම මේ අදහස් පළ කළේ ත්‍යාග ප්‍රදාන උත්සවයක දී ය.

(4) දේශපාලඥයෝ අවංක වෙත් නම් රට නැංවීම අසීරු නැත.

33. (1) අධිවේගී මහා මාර්ග මේ වන විට හොඳින් නඩත්තු කර ඇත්තාහ.
(2) පස්වරු 5.00 ට පමණ සභා තොමෝ සතුටින් විසිර ගියා ය.
(3) ගුරුවරුන් ශිෂ්‍යයන් කැටුව අධ්‍යාපන චාරිකාවක යෙදුණා හ.
(4) නියෝජිතයෝ වාර්ෂික සම්මේලනයට එති' යි අපි අපේක්ෂා කරමු.

34. (1) නුඹලා රටේ සාමය අරක්‍ෂා කරන නිර්භීත නායකයන් ලු.
(2) දරුවන්ගේ විභාග ප්‍රතිඵල අසා ගුරුවරු අමන්දානන්දයට පත් වූහ.
(3) රාජ්‍ය සේවකයෝ පාලකයෝ වෙත සිය ඉල්ලීම් ඉදිරිපත් කළහ.
(4) ගුරු සංගමයේ සාමාජිකයෝ බලාපොරොත්තු වන්නේ මොනවා ද?

35. නිවැරදි කර්මකාරක වාක්‍යය දැක්වෙන වරණය තෝරන්න.
(1) විද්‍යා උපාධිධාරීන් පන්සිය දෙනෙක් ගුරු සේවයට බඳවා ගැනෙති.
(2) විද්‍යා උපාධිධාරීහු පන්සිය දෙනෙකු ගුරු සේවයට බඳවා ගැනේ.
(3) විද්‍යා උපාධිධාරීහු පන්සිය දෙනෙකු ගුරු සේවයට බඳවා ගැනෙති.
(4) විද්‍යා උපාධිධාරීහු පන්සිය දෙනෙක් ගුරු සේවයට බඳවා ගැනෙති.

36. පහත දී ඇති කාව්‍ය ඛණ්ඩයේ හතරවැනි පද්‍ය පදය තෝරන්න.

මූණ රවාගෙන ගෙට    වැදිලා
පුන නූල ඇද දමමින්    බිඳලා
යානේ උන් බමුණා බිම    පෙරළා
................................    ...........

(1) කුදේ ගැසී නැගිටින කල    වෙවුලා
(2) තදේ කැසින් කැස කැසපට    අකුලා
(3) සොදේ විඳින සැප විදුමට    මෙකලා
(4) බාන ලෙසට අල්ලා ගෙන    රවුළා

37. නිවැරදි අදහස සහිත වරණය තෝරන්න.
(1) ''තොමෝ'' යනු ස්ත්‍රීවාචී ගෞරවාර්ථ බහු වචන පදයකි.
(2) ප්‍රශ්නවාචී යෙදුමකින් අවසන් වන වාක්‍යක කර්තෘ හැමවිට ම උක්ත වේ.
(3) ''ඔබ'' යන සර්ව නාම පදය ඒක වචන හා බහු වචන දෙඅර්ථයට ම ගැනේ.
(4) සමඟ, කැටුව යන නිපාත හා බැඳුණු නාම පදය උක්ත රූප ගනී.

38. ''ගවයෝ'' යන පදයෙහි නාම ප්‍රකෘතිය වන්නේ,
(1) ගවයා' ය. (2) ගවයන්' ය. (3) ගව' ය. (4) ගවය' ය.

39. ක්‍රියා විශේෂණයක් රහිත වාක්‍යය ඇතුළත් වරණය කුමක් ද?
(1) ශ්‍රී ලංකා ක්‍රීඩකයෝ එක් දින ක්‍රිකට් තරගය පහසුවෙන් ජයගනිති.
(2) මෙවර යල කන්නයේ ගොවීහු සරු අස්වැන්නක් ලැබූහ.
(3) සන්දර්ශනය නැරඹීමට පැමිණි ඔබ හැම දෙනා සාදරයෙන් පිළිගනිමු.
(4) බොහෝ ගැමියෝ අඟ හිඟකම් ඇතත් සතුටෙන් කල් ගෙවති.

40. දී ඇති ඡේදයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.

''යම් කතා පුවතක් හෝ සිදුවීමක් ඇසුරෙන් නාට්‍ය පෙළක් නිර්මාණය කිරීමේ දී එම කතා පුවතේ හෝ සිදුවීමේ ඇති සෑම අවස්ථාවක් ම හෝ සිද්ධියක් ම යොදා නො ගෙන සුදුසු අවස්ථා පමණක් යොදා ගත යුතු ය.

(1) නාට්‍ය පෙළක් නිර්මාණය කිරීමේ දී කතා පුවතේ ඇතුළත් සුදුසු අවස්ථා හා සිදුවීම් පමණක් යොදා ගත යුතුය.
(2) නාටණ පිටපත් රචනය සඳහා උපයෝගී කර ගත යුත්තේ සුදුසු අවස්ථා මත පදනම් වූ සැබෑ සිදුවීම් ය.
(3) සුදුසු අවස්ථා පදනම් කරගත් නාට්‍ය සඳහා කථා පුවතක් තෝරා ගැනීමේ නිදහස නාට්‍ය රචකයාට හිමි වේ.
(4) නාට්‍ය රචකයා හැම විට ම සිත යොමු කරන්නේ නාට්‍ය පෙළේ සුදුසු අවස්ථා හා සිද්ධීන් ගෙනහැර දැක්වීමට ය.

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## පෙර'ඹරට සවියක් ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන

| සිංහල භාෂාව හා සාහිත්‍යය II | 11 ශ්‍රේණිය | කාලය : පැය 02 යි |
|---|---|---|

- සැලකිය යුතුයි.

❖ ප්‍රශ්න සියල්ලට ම උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

01. **:ස*** සිට **:o*** තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) සිංහල අක්ෂර මාලාවේ පහත සඳහන් අක්ෂර උපන් ස්ථානය අනුව අයත්වන වර්ගය නම් කරන්න.

(අ) ප (ආ) ට

(ii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

'' ලෝක ජනගහනය සීඝ්‍රයෙන් වර්ධනය වන අතර මනුෂ්‍ය පරමායුශ ද ඉහළ නඟිමින් පවතී.''

(iii) පහත සඳහන් පද නිවැරදි ව සන්ධි කර ලියන්න.

(අ) අති ॰ උදාර (ආ) වත් ॰ හල

(iv) පහත සඳහන් වාක්‍යවල ඇතුළත් තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියාපද වර්ගය ලියන්න.

(අ) එවැනි විපත් යළි කිසි දින **<u>නොම වේවා.!</u>**

(ආ) ඇය වේදිකාවෙන් **<u>බැස යද්දී</u>** ප්‍රේක්ෂකයෝ අත්පොළසන් දුන්හ.

(v) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් නිපාත පද දෙකක් උපුටා ලියන්න.

'' මේ මිනිස් ලොව නම් පූර්වයෙහි ඖෂධයෙන් ම මවන ලද වන ''

(vi) පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි පදයේ විභක්තිය ලියන්න.

(ආ) බුදුහු <u>නුවණින්</u> ලොව දුටහ.

(ආ) උපාසිකාවෝ <u>සඟරුවනට</u> දන් දුන්හ.

(vii) පහත සඳහන් වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.

(අ) අප පාසලේ ක්‍රීඩකයෝ තරගයේ ජයග්‍රාහකයන් වූහ.

(ආ) කොටියෙකු දුටු මුවන් බිය වී පැන දිවූහ.

(viii) පහත සඳහන් අදහස්වලට ගැලපෙන තනි පදය බැගින් ලියා දක්වන්න.

(අ) උරුමයට බිම් අඟලක්වත් නැති

(ආ) දීර්ඝ කාලයක් තිස්සේ නොනැසී පවතින.

(ix) පහත සඳහන් යෙදුම්වල පළමුවැනි හෝ දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමු වචනය හෝ දෙවැනි වචනය හෝ සකස් කර ලියන්න.

(අ) ප්‍රථම තෑග්ග

(ආ) පිරිත් දේශනය

(x) පහත සඳහන් වාක්‍ය කර්ම කාරකයට හරවා ලියන්න.

(අ) නිලධාරීහු ආයතනයේ පවිත්‍රතා කටයුතු සඳහා කම්කරුවන් යෙදවූහ.

(ආ) ගෙවතු වගා කරුවෝ තරඟයට ඉදිරිපත් වීම සඳහා අයදුම් පත්‍ර ඉදිරිපත් කළහ.

02. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) අතීතයේ අපේ රට ස්වයං පෝෂිත ආර්ථික ක්‍රමයක් පැවති රටකි. අපේ අතීත මී මුතුන් රට ගොඩනැගුවේ කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය කර ගනිමිනි. නූතනයේ කෘෂි කර්මාන්තයෙහි නියැලෙන ගොවියාට මුහුණ දීමට ඇති අභියෝග රැසකි. රසායනික පොහොර මත යැපෙමින් විශාල අස්වැන්නක් ලබා ගැනීමට හුරු පුරුදු වූ ගොවියා එක් වරම කාබනික පොහොර භාවිතයට හුරු කරවීම සඳහා රසායනික පොහොර මෙරටට ගෙන්වීම තහනම් කෙරිණි. රටක් ගොඩනැගීමට ප්‍රතිපත්ති අවශ්‍ය ය. එමෙන් ම කාලය ද අවශ්‍යය. මේ අභියෝග ජය ගැනීමට නම් සියලු දෙනා එකාවන්ව කටයුතු කළ යුතුව ඇත.

(ආ) මුළු ලෝකයා අභිමුවෙහි ඇත්තේ දරුණු වසංගතයකි. එයින් පීඩාවට පත් වූවන් මෙතෙකැයි කිව නොහැකි තරම් ය. කොරෝනා වසංගතයෙන් ලෝකයට අහිමි වූ ජීවිත ගණන විශාල ප්‍රමාණයකි. එයින් ජීවිතවලට මෙන් ම සෑම රටක ම ආර්ථිකයට ද මරු පහරක් විය. තවමත් සංවර්ධනය වෙමින් පවතින තුන්වන ලෝකයේ රටක් වන අපේ රටට ද මෙයින් දැඩි බලපෑම් එල්ල විය. සෞඛ්‍ය ක්ෂේත්‍රයට විශාල කාර්යභාරයක් පැවතුණ ද මෙය රටේ පුරවැසියන් ලෙසින් අපට ද විශාල කාර්යභාරයක් පැවරී තිබේ. එය තේරුම් ගෙන අනාගතය යහපත් කර ගැනීමට අප කුමක් කරමු ද?

(ඉ) තාක්ෂණය අද මිනිසාගේ ජීවිතය බවට පත් වී තිබීම නොරහසකි. එයින් අත් මිදීමට නොහැකි තරමට අද තාක්ෂණය තුළින් දැවැන්ත කාර්යභාරයක් මිනිසා ඉටුකර ගනියි. පසුගිය වසර කීපය තුළ ලෝක වසංගතය හමුවේ අඩාල වී ගිය අධ්‍යාපනයට ද තාක්ෂණය යොදා ගැනීමට බොහෝ උනන්දු වූ බව පෙනේ. ඒ හරහා මාර්ගගත අධ්‍යාපනයට සියලු දරුවන්ට විවිධ අභියෝග හමුවේ අනුගත වීමට සිදු විය. ඒ තුළින් අධ්‍යාපන ක්‍රියාවලියට සිදු වූ යහපත මෙන් ම අයහපත ද අද කතා කළ යුතු ම දෙයක් බවට පත් වී ඇත.

(ඊ) සංවර්ධනය වන කවර රටක වුව ද වැදගත් අංගයකි. ගමනාගමනය, අපේ රටේ ද මහජනයාගේ දැඩි අවධානයට ලක් වී ඇති ප්‍රවාහන සේවය සංවර්ධනය කිරීම රටේ අභිවෘද්ධියට බෙහෙවින් ඉවහල් වේ. වර්තමානයේ අපේ රටේ පවත්නා පොදු ගමනාගමන ක්‍රම ගැන විවිධ යෝජනා හා චෝදනා නිතර නිතර අසන්නට ලැබේ. වැඩිවන මගීන් සංඛ්‍යාව, මාර්ග තදබදය, රියදුරන්ගේ නීති ගරුකත්වය ආදී විවිධ අංශ එහි ලා ප්‍රධාන තැනක් ගනී. රථ වාහන සංඛ්‍යාව වැඩි කිරීමෙන් හෝ මාර්ග සංවර්ධනය කිරීමෙන් හෝ පමණක් වේ. ප්‍රශ්න විසඳීම දුෂ්කර ය. මෙහි ලා මහජන සහයෝගය ඉහළ තැනක් ගනී.

03. පහත දැක්වෙන පාඨය වචන 55 - 65 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

යෞවන ප්‍රබන්ධවල කාලීන අවශ්‍යතාව අවබෝධ කරගත් කුලසේන ෆොන්සේකාගේ තුන් යහළු වික්‍රමය (1983), සෝමපුර වීරයෝ (1987), කල්ලන්දූවේ මුතු කොල්ලය (1988) යන ග්‍රන්ථවල ප්‍රධාන තේමාව වී ඇත්තේ ගැටවරයන්ගේ වික්‍රමාන්විත ක්‍රියා ය. මේ කෘති තුනෙහි ම රුවන්, සුනිල් හා අජිත් යන මිතුරන් තිදෙනා ප්‍රධාන චරිතයෝ වෙති. ඔවුන්ට නොයෙකුත් අවදානම් සහිත වික්‍රමයන් හි යෙදීමට සිදුවනුයේ ගවේෂණයට ඔවුන් තුළ වූ අභිලාෂය හේතුවෙනි. ඔවුන්ගේ ගවේෂණයේ අවසාන ප්‍රතිඵලය සැමවිට ම සුබදායක ය. පුද්ගලයන් කිසියම් ආකාරයක දූෂිත හෝ සාපරාධී ක්‍රියාවක් ආවරණය කිරීමට ගැටවරයෝ තිදෙනා සමත් වෙති. උදාහරණයක් ලෙස මිනිසුන් තිදෙනෙකු නිදන් හාරනු සොයා ගැනීමත්, එම නිදන් හොරුන් තොරතුරු ලබා ගැනීම සඳහා අල්ලා බැඳගෙන සිටි පාසල් ගුරුවරුන් බේරා ගැනීමටත් මිතුරන් තිදෙනා සමත්වන ආකාරය සෝමපුර වීරයෝ කථාවෙන් නිරූපණය වේ. ඉංග්‍රිසි ලේඛිකා ඊනිට් බ්ලයිටන් ගේ යොවුන් කථාවල ශෛලිය හා තේමාවන් කුලසේන ෆොන්සේකා කෙරෙහි බල පෑ බව පැහැදිලි ය. පස් දෙනෙකුගේ කණ්ඩායමක් වශයෙන් වීර ක්‍රියාවල නියලුණු ළමා චරිත ඊනිට් බ්ලයිටන්ගේ කථා පෙළක ඇත.

04. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

යටත් විජිත සමයේ දී බොහෝ අප්‍රිකානු ලේඛකයෝ පාලකයන් වර්ණනා කරමින් ඔවුන්ගේ චර්යා රටා අනුව හැඩ ගැසීමටත් ඔවුන් අනුකරණය කිරීමටත් වෑයම් කළහ. ඔවුන් රට, දැය සමය පිළිබඳව හැඟීමක් ඇති ව සිය අනන්‍යතාව විදහා දක්වමින් අදීනව සිතුම් පැතුම් පළ කරන්නට පටන් ගත්තේ දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුවයි. මේ සඳහා ඉංග්‍රිසි, ප්‍රංශ වැනි බටහිර භාෂා සිය අවශ්‍යතාවන්ට සරිලන පරිදි සකස් කර ගැනීමට ඔවුන් කරන වෑයම එලකට අයත් අප්‍රිකානු නවකතා හා කාව්‍ය ග්‍රන්ථවලින් හෙළි වේ. චිනුවා අචිබිගේ නවකතාවල එන පුද්ගලයන් භාවිත කරන අප්‍රිකානු ඉංග්‍රීසි මෙයට එක් නිදසුනකි. එසේ වුව ද ඉංග්‍රිසි හා ප්‍රංශ සාහිත්‍ය කෘතීන් ආශ්‍රයෙන් ලබන ලද යුරෝපීය බලපෑම අප්‍රිකානු ලේඛකයන්ගේ කෘතීන් හි නොමදව කැපී පෙනේ. අප්‍රිකානු රටවල් සිය පාලනයට යටත් කර ගත් ප්‍රධාන ජාතීන් දෙක වන ඉංග්‍රිසි හා ප්‍රංශ ජාතීන් අතුරෙන් ප්‍රංශ ජාතිකයෝ අප්‍රිකානුවන්ට බටහිර සංස්කෘතියට හැඩ ගැසෙන්නට ඉඩ දුන්හ. ඔවුහු අප්‍රිකානුවන්ගේ කළු පැහැයට නිගරු නොකළහ. අභිමානවත් ජාතියක් වුවත් ඔවුන් කළු පැහැය හෙළා දුටු ඉංග්‍රීසීන්ට වඩා මිනිස්කමින් හා හැකියාවෙන් සිය විශිෂ්ටත්වය විදහා දැක්වූහ. ප්‍රංශ බසින් ලියන්නටත් සිතන්නටත් පුරුදු වූ ජීන් ජෝශප් රැබිරිවෝලෝ නම් දක්ෂ කවියෙකු 1920 ගණන්වල දී මැඩගස්කරයෙන් බිහිවූයේ එම නිසා ය.

(i) අප්‍රිකානු ලේඛකයන්ගේ සාහිත්‍ය නිර්මාණයන් හි නොඅඩුව කැපී පෙණුන ලක්ෂණය කුමක් ද?

(ii) යටත් ජාතීන් ලෙෂ ගෙවූ කාලයේ අප්‍රිකානු ලේඛකයින් බලවත් ලෙස උනන්දු වූ කරුණු 02 ක් නම් කරන්න.

(iii) චිනුවා අචිබිගේ නවකතාවල එන අප්‍රිකානු ඉංග්‍රිසි නිදසුනක් වූයේ කවරකට ද?

(iv) ප්‍රංශ හා ඉංග්‍රීසි ජාතිකයින්, අප්‍රිකානුවන්ට බටහිර සංස්කෘතියට හැඩ ගැසීමට නිදහස දුන් බවත් මේ ලේඛකයා පවසයි ද?

(v) පහත වචනවල අර්ථය ලියන්න.

(අ) සමය (ආ) සංග්‍රාමය

05. අක්‍රමවත් ලෙස කැළි කසල බැහැර කිරීම නිසා පරිසර පවිත්‍රතාව බිඳ වැටීමත්, පානීය ජල සැපයුම හා විදුලි බලය වරින් වර බිඳ වැටීමත් නිසා නගර වැසියෝ මහත් දුෂ්කරතාවලට මුහුණ දෙමින් නිතර මැසිවිලි නගති. ඔබ නාගරික ප්‍රජා මූල සංවිධානයේ බදු ගෙවන්නන්ගේ සංගමයේ ලේකම් යැයි සිතා මෙම ගැටලුව වහා ම විසඳා දෙන ලෙස දන්වමින් නාගරික කොමසාරිස්වරයාට යැවිය යුතු ලිපිය පිළියෙල කරන්න. ලිපිය ලියන ඔබ එම සංගමයේ ලේකම් භානුක විජේමාන්න යැයි සිතන්න.

නැතහොත්

නිකවැරටිය වීදිය බණ්ඩාර මහා විද්‍යාලයේ ඡායාරූප සංගමය '' ඡායාරූපකරණය පිළිබඳ දැනුම නිර්මාණාත්මක ව කුසලතා හා රසවින්දන ශක්තීන් දියුණු කිරීමේ අරමුණින්'' ඇසි දිසි - ඡායාරූප ප්‍රදර්ශන සතියක් සංවිධානය කිරීමට තීරණය කර ඇත. මෙවර එහි තේමාව ''ඇසි දිසි - මලක අසිරිය'' නමින් නම් කර ඇත. මෙහි දී මලක අසිරිය ආධුනික ඡායාරූප ශිල්පීන් විසින් ඡායාරූප ගත කොට ප්‍රදර්ශනය කරනු ලබන අතර පළමු ස්ථානය - 15000/-, දෙවන ස්ථානය - 10000/-, තෙවන ස්ථානය - 7500/- බැගින් හොඳම ඡායාරූප ත්‍රිත්වය සඳහා ත්‍යාග හා සහතිකයන් පිරිනැමේ. 09 ශ්‍රේණියේ සිට ඉහළ සිසුන් සඳහා මේ සඳහා සහභාගි විය හැකිය. මේ පිළිබඳව දැනුවත් කිරීම සඳහා සුදුසු දැන්වීමක් සකස් කරන්න.

# මතුගම අධ්‍යාපන කලාපය

## පෙර'ඹරට සවියක් ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන

**සිංහල භාෂාව හා සාහිත්‍යය III** | **11 ශ්‍රේණිය** | **කාලය : පැය 02 යි**

- සැලකිය යුතුයි.
  - ❖ උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.
  - ❖ 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

01. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) ''ඇයි ? කුමක් කියවු ද? මම ගොවියා පුතු නොවැන්දෙමි.

(අ) මේ ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම ලියන්න.

(ආ) ''ගොවියා පුතු'' යනුවෙන් හැඳින්වෙන්නේ කවරෙක් ද?

(ii) ''සිය පින් සිරින් සරු
දෙතිස් ලකුණින් විසිතුරු
කෙලෙසුන් කෙරෙන් දුරු
වදිමි මුනි උතුමන් තිලෝගුරු

(අ) මේ කවියෙන් ඇරඹෙන කාව්‍ය ග්‍රන්ථය කුමක් ද?

(ආ) 'සියපින්' යන්නෙහි යොදා ඇති අනිෂ්ට යැයි සැලකෙන ගණය නම් කරන්න.

(iii) ''මා විසින් බොහෝ සත්හු දැනැ මරන ලදහ''

(අ) මෙසේ ප්‍රකාශ කළ තැනැත්තා කවරෙක් ද?

(ආ) මෙම පාඨය උපුටාගත් මුල් කෘතියේ නම කුමක් ද?

(iv) ''මිහඹු මුව මඩල මෙන් දිලෙන හැම විට
දුලබ ඉසුරු පිරි සැදී ඒ වෙහෙර සිට

(අ) මෙහි දැක්වෙන උපමාව උපුටා ලියන්න.

(ආ) මෙහි විස්තර කෙරෙන විහාරය කුමක්ද?

(v) ''මට වැඩ තියෙනවා ඕනෑ කෙනෙක් එක්ක අඹර ගන්න''

(අ) මෙය ඇතුළත් කෘතියේ රචකයා කවුරුන් ද?

(ආ) මෙහි 'අඹර ගන්න' යැයි පැවසුවේ මොනවා ද?

(vi) වැහි වලාකුළු රංචු - කඳු මුදුන්වල ලගින
දැන් ඒවි තැනි බිමට - සීතලයි මගෙ සිතට

(අ) මේ කොටස ඇතුළත් කාව්‍ය නිර්මාණය නම් කරන්න.

(ආ) මෙම නිර්මාණයේ රචකයා කවුරුන් ද?

(vii) (අ) සැළලිහිණි සන්දේශය රචනා කළේ කවුරුන් ද?

(ආ) සිංහලයේ දැනට ඇති පැරණිතම සංදේශය කුමක් ද?

(viii) ''ඔව්, ඇමති මැදුරෙ ශාලාවේදී මං ඒක අතගාලත් බැලුවා''

(අ) මෙම ප්‍රකාශ කරන්නේ කවු ද?

(ආ) ''ඒක'' යනුවෙන් අදහස් වන්නේ කුමක් ද?

(ix) පහත දැක්වෙන ග්‍රන්ථවලට මූලාශ්‍රය වූ පාලි ග්‍රන්ථ මොනවා ද?

(අ) සද්ධර්මරත්නාවලිය

(ආ) පන්සිය පනස් ජාතක පොත

(x) ''හේනේ පැලේ මා විඳිනා සුරුක්කන්
උඹරෝ ඇවිත් වටපිට කරති සක්මන්''

(අ) මෙම කවිය ඇතුළත් ජනකවි වර්ගය කුමක් ද?

(ආ) මෙහි ගොවියා මුහුණ පාන අභියෝගය කුමක් ද? (ලකුණු 2x10=20)

02. පහත දී ඇති ගද්‍ය පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) ''ඒ විද්දත් දූත් නොබෝ කලකින් සිටුපුත් හට පුතකු වදා පියා නළවන කල'' ගැල් රකිනවුගේ පුත, බර උසුලන්නවුගේ පුත, කුමක් නොදන්නවු ගේ පුතැ'යි කිය කියා නළවයි.

(අ) බිරිඳගේ ගර්භාවට ලක් වූ සිටු පුත්‍රයාගේ කාර්යයන් දෙකක් ලියන්න.

(ආ) බිරිඳගේ ගර්භාවන් වලක්වා ගැනීමට සිටු පුත්‍රයා ක්‍රියා කළ ආකාරය කෙටියෙන් ලියන්න.

(ii) කස්තුරි තිලක සැදි නළලත සුමටාන
<u>පුල් මහනෙල්</u> මල්දම් හිස දවටාන
සළෙලුන් යනෙන නිති කැර කෙළි කවටාන
<u>රිවි</u> මුදුනත වන මැද වදු සුමුටාන

(අ) කවියා දූතයාට වන පෙත මැදට ඇතුළු වන්නට තියෙන්නේ කවර වේලාවක ද?

(ආ) අංකිත පදවල අරුත් ලියන්න.

(i) පුල් මහනෙල් -

(ii) රිවි -

(iii) ''තුමුල් ගතින් දා
බාහු බෙලෙන් දා
වෙමි සේ තිදසින් දා
කුරිරු ගිජින් දා
කුඹු කල සින්දා
ලම් සේ කෙසරින්දා

(අ) සක් දෙවිඳු හා සිහ රජු යන අර්ථ දෙන වචන දෙක උපුටා ලියන්න.

(ආ) මෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

(iv) දෑතේ කර ගැට සිඹ සනසන්නට

ළා ගොයමේ දලු පවන් සලයි

දහදිය මුතු ඇට මල් වරුසා වී

කරල් බරින් පී දී වැගිරෙයි

(අ) මේ කවියේ ඇතුළත් ව්‍යංග්‍යාර්ථය කුමක් ද?

(ආ) මෙහි එන රූපකාර්ථවත් යෙදුම උපුටා ලියන්න.

(v) ''ඒ බසින් නුවරවාසීහු සත් අවුරුද්දේ පටන් ඔබගේ බල තමන් ඇම ඉඳුරා දන්නා හෙයින් කිසි බයක් නැති වැ සංකා රහිත වැ නැටුම් ආදී සියල්ලෙන් ම මහතාණන් වදාළ පරිද්දෙන් උත්සවයට පටන් ගත්හ.''

(අ) මෙසේ උත්සවයක් ආරම්භ කිරීමට තුඩු දුන් හේතුව කුමක් ද?

(ආ) පහත සඳහන් වචනවල අර්ථය ලියන්න.

(i) තමන් ඇම -

(ii) සංකා රහිත වැ - (ලකුණු 4x5 =20)

03. අඟුල්මල් දමනය කථාවේ සාර්ථකත්වයට බලපා ඇති,

(i) සාර්ථක අවස්ථා හා සිද්ධි නිරූපණය හා

(ii) අවස්ථාවට උචිත භාෂා භාවිතය යන කරුණු එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

ධර්මසේන හිමියන්ගේ කථාවෙහි එන,

(i) උග්ගසේන සිටු පුත්‍රයාගේ හා

(ii) විද්දත් දුවගේ චරිත සංකීර්ණ ගති ලක්‍ෂණවලින් යුතුව දැක්වීමට ධර්මසේන හිමියන් සමත් වී ඇත. සද්ධර්මරත්නාවලියේ ඇතුළත් නිර්දිෂ්ට කථාව ඇසුරෙන් උදාහරණ දක්වමින් විස්තර කරන්න. (ලකුණු 15)

04. සැළලිහිණි සන්දේශය රසවත් කාව්‍ය නිර්මාණයක් බවට පත් ව ඇත්තේ එහි ඇතුළත් කාව්‍යෝක්ති,

(i) අර්ථ රසයෙන්ද,

(ii) ශබ්ද රසයෙන් ද මනාව සංකලනය වීම නිසා ය. උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.

නැතහොත්

ගුත්තිල ජාතකය කාව්‍යට නැගීමේ දී,

(i) සරල වහරින් හා,

(ii) වියත් වහරින් මනාව ගළපා යන්නට සමත් වූ අයුරු පාඩම ඇසුරෙන් උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 15)

05. ''වස්සානය කාව්‍ය නිර්මාණය චමත්කාරජනක පරිසර වර්ණයකි.'' උදාහරණ තුනක් ඇසුරෙන් මේ කියමන සනාථ කරන්න.

06. බැද්දේගම නවකතාව තුළින් එම ගම් වැසියන්ගේ ජීවිතවල ඇති කටුක බව මැනවින් නිරූපණය කරයි. උදාහරණ තුනක්වත් දෙමින් පැහැදිලි කරන්න.

07. අපට වැසිකිළියක් කෙටිකතාව තුළින් වැසිකිළි සැකසීමේ ව්‍යාපාරය ජය ගැනීමට සෞඛ්‍ය පරීක්ෂකවරයා යෙදූ උපක්‍රම බෙහෙවින් ඉවහල් විය. උදාහරණ තුනක්වත් දක්වමින් මේ කරුණු විමසන්න.

# පිළිතුරු

## 11 ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - I - II - III

**කාලය පැය : 05 යි**

### I කොටස - පිළිතුරු

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (01) | 1 | (11) | 3 | (21) | 4 | (31) | 3 |
| (02) | 2 | (12) | 2 | (22) | 3 | (32) | 4 |
| (03) | 1 | (13) | 4 | (23) | 1 | (33) | 2 |
| (04) | 2 | (14) | 1 | (24) | 3 | (34) | 2 |
| (05) | 3 | (15) | 2 | (25) | 4 | (35) | 4 |
| (06) | 3 | (16) | 3 | (26) | 1 | (36) | 4 |
| (07) | 3 | (17) | 2 | (27) | 3 | (37) | 3 |
| (08) | 2 | (18) | 4 | (28) | 1 | (38) | 3 |
| (09) | 2 | (19) | 1 | (29) | 4 | (39) | 2 |
| (10) | 1 | (20) | 4 | (30) | 2 | (40) | 1 |

### II කොටස - පිළිතුරු

(i) (අ) ඕෂ්ඨජ (ආ) මූර්ධජ

(ii) ශීඝ්‍රයෙන් / පරමායුෂ

(iii) (අ) අත්‍යුදාර (ආ) වත්තල

(iv) (අ) ආශිර්වාද ක්‍රියා / ප්‍රාර්ථනා ක්‍රියා (ආ) කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා

(v) මේ, නම්, ම

(vi) (ආ) කරණ විභක්ති (ආ) සම්ප්‍රදාන විභක්ති

(vii) (අ) අප පාසලේ ක්‍රීඩකයෝ තරගයේ ජයග්‍රාහකයෝ වූහ.
(ආ) කොටියෙකු දුටු වුවෝ බිය වී පැන දිවූහ.

(viii) (අ) කල්ලතෝනි (ආ) චිරස්ථායි

(ix) (අ) ප්‍රථම ත්‍යාගය / පළමු තෑග්ග (ආ) පිරිත් දෙසුම

(x) (අ) නිලධාරීන් විසින් ආයතනයේ පවිත්‍රතා කටයුතු සඳහා කම්කරුවෝ යොදවනු ලැබූහ/ ලැබුවෝ ය/ ලදහ.

(ආ) ගෙවතු වගා කරුවන් විසින් තරගයට ඉදිරිපත් වීම සඳහා අයදුම් පත්‍ර ඉදිරිපත් කරන ලදී/ කෙරිණි.

02. රචනය

| | | |
|---|---|---|
| සාරවත් භාවය, මාතෘකාවද ඇතුළුව | - | 08 |
| සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය | - | 12 |
| ශිල්පීය දක්ෂතා | - | 05 |
| | | 25 |

03' idrdxYh

| | | |
|---|---|---|
| අන්තර්ගතය | - | 06 |
| වචන ගණන | - | 02 |
| ශිල්පීය දක්ෂතා | - | 02 |
| | | 10 |

කරුණු,

- ❖ යෞවන ප්‍රබන්ධවල කාලීන අවශ්‍යතාව අවබෝධකරගත් ලේඛකයෙක් ලෙෂ කුලසේන ෆොන්සේකා හැඳින්විය හැකිය. නවකතාවල මොහුගේ ප්‍රධාන තේමාව වී ඇත්තේ ගැටවරයන්ගේ වික්‍රමාන්විත ක්‍රියා ය.
- ❖ ඒවාහි ප්‍රධාන චරිත නොයෙකුත් අවදානම් සහිත වික්‍රමයන්හි යෙදුණි.
- ❖ යෞවනයන තුළ ඇති ගවේෂණයට ඇති අභිපාෂය ඉන් ධ්වනිත වේ.
- ❖ අවසානයේ ඍද්රිතවල අභිලාෂය මුදුන් පැමිණීම ස්වභාවය විය.
- ❖ බොහෝ විට මොහුගේ නවකතාවලට බලපා ඊනිට් බ්ලයිටන් ගේ යොවුන් කථාවල ශෛලිය හා තේමාවන් ය.

04' (i) යුරෝපීය බලපෑම

(ii) * පාලකයන් වර්ණනා කිරීම.

* ඔවුන්ගේ චර්යා රටා අනුව හැඩ ගැසීම.

* ඔවුන් අනුකරණය කිරීම.

(iii) බටහිර භාෂා තම අවශ්‍යතාවන්ට සරිලන පරිදි සකස් කර ගැනීම.

(iv) ඔව්

(v) (1) සමය - ආගම (2) සංග්‍රාමය - යුද්ධය

05. රාජකාරී ලිපිය

| | | |
|---|---|---|
| ආකෘතිය | - | 05 |
| අන්තර්ගතය | - | 07 |
| ශිල්පීය දක්ෂතා | - | 03 |
| | | 15 |

දැන්වීම

| | | |
|---|---|---|
| ආකෘතිය | - | 05 |
| අන්තර්ගතය | - | 07 |
| ශිල්පීය දක්ෂතා | - | 03 |
| | | 15 |

## III කොටස - පිළිතුරු

(1)

| | | | | |
|---|---|---|---|---|
| (i) | (අ) | සතර කන් මන්ත්‍රණය | (ආ) | මහෞෂධ පඬිතුමා |
| (ii) | (අ) | ගුත්තිල කාව්‍ය | (ආ) | වායු ගණය |
| (iii) | (අ) | අංගුලිමාල තෙරණුවෝ | (ආ) | අමාවතුර |
| (iv) | (අ) | විහ'ඹ මුව මඬල මෙන් | (ආ) | කෑරගල වෙහෙර |
| (v) | (අ) | කේ. ජයතිලක | (ආ) | කුරක්කන් |
| (vi) | (අ) | වස්සානය | (ආ) | රත්න ශ්‍රී විජේසිංහ |
| (vii) | (අ) | තොටගමුවේ ශ්‍රී රාහුල හිමි | (ආ) | මයුර සංදේශය |
| (viii) | (අ) | මැටිල්ඩා/ ලෙයසිල් මහත්මිය | (ආ) | දියමන්ති මාලය |
| (ix) | (අ) | පාලිධම්ම පචට්ඨ කතාව | (ආ) | පාලි ජාතකට්ඨ කථාව |
| (x) | (අ) | කරහන් කවි | (ආ) | උෟරන් වගා පාළු කිරීම |

(2) (i) (අ) ගැල් ආරක්ෂා කිරීම/ බර උසුලාගෙන යාම

(ආ) ඇයගේ මේ බැනුම් මග හරවා ගැනීමට එකම පිළියම නම් එම ශිල්පය තමා ඉගෙන ගෙන ශිල්පියෙක් බවට පත්වීම බව සිතා ඇගේ පියාගෙන් ශිල්ප ඉගෙන ගෙන දින 07 ක් ඇතුළත් ශිල්ප පෙන්වීම.

(ii) (අ) ඉර මුදුන් වන වේලාවට

(ආ) 01. පිපුණු මහනෙල්

02. සූර්යයා/ හිරු

(iii) (අ) සක් දෙවිඳු - තිදසින් දා

සිහ රජ - ගිජින් දා/ කෙසරින් දා

(ආ) විශාල ශිරීරයකින් හා බාහුබල බලයෙන් ශක්‍ර දේවේන්ද්‍රයා මෙන් වූ නපුරු හස්තීන්ගේ තුම්බස්තලය සිඳින සිංහ රාජයෙක් මෙන්

(iv) (අ) ඉතා වෙහෙස වී වැඩ කර එහි වෙහෙස සරුසාර ළා ගොයම නිසා නිවී යන බව,

(ආ) දහදිය මුතු ඇට මල් වරුසා වී

(v) (අ) මියුලු නුවර අටලොස් අක්ෂෞහිණියක් සේනාව විසින් වටලා ගැනීම නිසා ඔවුන් නොමඟ යැවීමම යෙදූ උපායකි.

(ආ) තමන් සියලු දෙනාම/ කිසිඳු සැකයක් නැතිව

රසාස්වාද ප්‍රශ්න සඳහා ගැළපෙන පිළිතුරු සඳහා ලකුණු පිරිනමන්න.

(03) (i) * ආචාර්යයා අනුව හා සසඟ උත්තේ යැයි බිඳැ පියම්හ.

* කිම මහරජ, තට බිම්සර මහරජ කුපිත වී යැහෙන

* මහ තෙරුනු කුලගම් සිඟන්නට ගිය කලා මිනිස්සු ඔවුන් දැකැ වෙවුලත් මැයැ.

* මහරජ තොප ගෙ රට අඟුල්මල් නම් සොරෙකු

* යම් කවර සිඟා භායකින් දමාලූ

(ii) * කතාව පුරාම අමිශ්‍ර සිංහල වදන් භාවිතය

* සංස්කෘත මිශ්‍ර තත්සම පද භාවිතය

* ඇ කාරය යොදා ගැනීම.

* අනුප්‍රාසවත් වදන් භාවිතය

* කෙටි වදන් භාවිතය

* මංවාද භාවිතය ආදී භාෂා ලක්‍ෂණ උදාහරණ දක්වමින් ඉදිරිපත් කල යුතුය.

නැතහොත්

(i) උග්ගසේන සිටු පුත්,

* හැඟීම්වලට වහල්ව කටයුතු කරන්නෙකු ලෙෂ මුල් කාලයේ කටයුතු කිරීම.

* ධෛර්යය සම්පන්නව කටයුතු කිරීම.

* අභියෝග ජය ගන්නෙකු වීම.

* මව්පියන්ට අකීකරු චරිතයක් වීම.

* ළාමක ආශාවක් නිසා තම ගෞරවය පිළිබඳව හෝ නොසිතීම.

මෙවැනි චරිත ලක්‍ෂණවලට උදාහරණ ඉදිරිපත් කළ තිබීම යුතුය.

(ii) විද්දත් දියණිය,

* තමන් දන්නා ශිල්පය නිසා උඩඟු තැනැත්තියක් වීම.

* තම රූපය, හැකියා නිසා තම පවුලට ආදායම් උපයාදීම.

* තම ස්වාමියා සිටු පුත්‍රයෙක් වුවත් ඔහු දන්නා ශිල්පයක් නොවූයෙන් ඔහුට නින්දා අපහාස කිරීම.

මේ ලක්‍ෂණ සඳහා උදාහරණ ඉදිරිපත් කර තිබේනම් ලකුණු ලබා දෙන්න.

(04) (i) අර්ථ රසය,

* ගනේ මිණි බැබදි කිරණෙවි සත්‍යය
* නිල තුරඟුට නැගෙමින් රිවි දෙව් සිරිත
* ගනේ මිණි බැබදි කිරණෙවි සත්‍යය
* නිමල් සඳ පහන් වැනි වැලි සිට උදුල
* මන සිරි පියුම්රා බඳ රන බරණ යුරු

ගැළපෙන උදාහරණ වලට ලකුණු පිරිනමන්න.

(ii) ශබ්ද රසය,

* එළිසමය (මුල, අග)
* අනුප්‍රාසය
* සමුද්‍රඝෝෂ වි‍රිත

ආදිය සඳහා උදාහරණ ඉදිරිපත් කර තිබේනම් ලකුණු පිරි නමන්න.

නැතහොත්

(i) සරල බස් වහර

* ගුත්තිල ඇදුරු සඳ
* සිදුවේ මැයි වෙසෙස
* දෙදෙනම ඉඳ දෙ පිට
* නවතා ගිගිරියෙ ....
* අප බෝසතුන් මිස
* තන මතු ද සිත් දේ
* කෙළෙහි ගුණ සින්දේ

(ii) වියත් වහර

* කැර මිණි බරණ රැස්
* දිය දිය ගොස ....
* පිය සන් බිගු දැල් ....
* කන් කලු වෙණ නද ....
* මන මන් කරවන දන ....

ගැලපෙන උදාහරණ සඳහා ලකුණු පිරිනමන්න.

05. සියලු කවි ඒ සඳහා උදාහරණ ලෙස විස්තර කළ හැකිය.

06. * ''පුංචි මැණිකාට හා කර්ලිනාහාමිටත් වේලක් ඇර වේලක් කා මාස හයක් ගත කර ගැනීමට සෑහෙන තරම් ධාන්‍යයක් වත් ගෙයි ඉතිරි වී නොතිබුණේ ය.

* කැලෑබද ගමක ගැහැනියකට විශේෂයෙන් වැන්දඹු ගැහැනියකට අවුරුදු පනහ ලොකු වයසකි.

* අව්ව හා සුළඟත් වෙහෙසක්, බඩගින්නක්, ලෙඩ දුකත් ශරීර ශක්තිය මෙන්ම මාසික ශක්තිය ද උරා බොයි.

* ඔවුන් වැඩ කරන්නේ ආසාවකින් හෝ සිහියකින් නොවේ.

ගැළපෙන උදාහරණ සඳහා ලකුණු පිරිනමන්න.

07 * ''කවුද මේ ගෙදර ලොක්කා''

* සුමාන දෙකක් ඇතුළත වැසිකිළියක් හදන්න ඕනෑ. මම ආයිමත් සුමාන දෙකකට පස්සෙ එනව. එතකොට වැසිකිළියක් හදලා නොතිබුණොත් නඩු දානව.

* කෝ වැසිළිකිය හැදුව ද? ඔහු ගිගුරුවේය.

* ලෑල්ල දැම්මට වැසිකිළියක් හැදෙනවද මිනිහෝ ....

ගැළපෙන උදාහරණ සඳහා ලකුණු පිරිනමන්න.

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone
மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்
මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය

# පෙර'ඹරට සවියක් ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන

| සිංහල භාෂාව හා සාහිත්‍යය I | 11 ශ්‍රේණිය | කාලය : පැය 01 යි |
|---|---|---|

- ❖ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- ❖ අංක 1 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති 1, 2,3, 4 යන පිළිතුරුවලින් වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න
- ❖ අංක 1-3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි ඉරි ඇඳි කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.

01. සමහර වැඩිහිටියෝ <u>හය හතර නොදන්නා</u> දරුවන් සේ ක්‍රියා කරති.
    1. දැනුම් තේරුම් නොමැති  2. උගත් කමක් නැති
    3. ඉලක්කම් නොදන්නා  4. පාසල් නොගිය

02. නව නිවාස සංවර්ධන ව්‍යාපෘති යෝජනා <u>හමස් පෙට්ටියට දමා</u> ඇති බවට පවසමින් ඇමතිවරයා නිළධාරීන්ට දෝෂාරෝපණය කළේය.
    1. පෙට්ටියකට දමා තිබීම.  2. ක්‍රියාත්මක නොවී තිබීම.
    3. විනාශ කර ඇති බව.  4. අනුමත නොවී තිබීම.

03. <u>පණට පණ මෙන්</u> සිටි දෙමිතුරෝ දැන් විරසකව සිටිති.
    1. ඉතා සහයෝගයෙන්  2. ඉතා දැහැමිව  3. ඉතා හිතවත්ව  4. නොවෙනස්ව

- ❖ 04 - 06 දක්වා ඇති ප්‍රශ්නවලට හිස්තැනට වඩාත්ම ගැළපෙන පිළිතුර තෝරන්න.

04. සිංහල පද්‍ය සාහිත්‍යයේ .............................. යුගය ලෙස කෝට්ටේ යුගය ලෙස සැලකේ.
    1.රජතමය  2. මියුරුතම  3. පෙරටුගාමී  4.ස්වර්ණමය

05. වීරෝදාර සෙබළු යුද්ධ ........................ වෙත අවතීර්ණ වූහ.
    1. පිටිය  2. අංගණය  3. භූමිය  4. බිම

06. කාව්‍ය නිර්මාණයට ........................ අත්‍යවශ්‍ය වේ.
    1.සතතාභ්‍යාසය  2. එළිසමය  3. උපමාලංකාර  4. අනුප්‍රාසය

07. අකාරාදී පිළිවෙළ අනුව නිවැරදි පද පේළිය තෝරන්න.
    1. පවන, පබල, පතළ, පහළ  2. පතළ, පබල, පවන, පහළ
    3. පහළ, පබල, පතළ, පවන  4. පබල, පහළ, පතළ, පවන

08. සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න
    1. ආභාෂය, ආශ්වාදය, කොට්ඨාශය, විශ්මය  2. ආභාසය, ආස්වාදය, කොට්ඨාසය, විස්මය
    3. ආභාෂය, ආශ්වාදය, කොට්ඨාසය, විස්මය  4. ආභාසය, ආස්වාදය, කොට්ඨාසය, විශ්මය

09. කෙටි පාපිල්ල, රකාරාංශය, ගයනුකිත්ත, රේඵය පිළිවෙළින් යෙදී ඇති පද පේළිය තෝරන්න.
    1.පූර්ව, ක්‍රියා, රුපියල, ගෞතම  2. සුරම්‍ය, කර්මීය, නෛතික, සෞම්‍ය,
    3. රුහුණු, ප්‍රවේගය, භෞමික, මාර්ගීය,  4.රැහැන, ධර්මීය, කෞතුක, ප්‍රසිද්ධ

මතුගම අධ්‍යාපන කලාපය

10. ″කෙළිමින් තැන තැන ලන්දු ″ මෙහි ″ කෙළිමින්″ යනු,

1. අසම්භාව්‍ය ක්‍රියාවකි 2. පූර්ව ක්‍රියාවකි 3. මිශ්‍ර ක්‍රියාවකි 4. විධි ක්‍රියාවකි

11. ″අම්මා සඳකි, මම ඒ ලොව හිරුය රිදී″ මෙම ගීත ඛණ්ඩයේ දැක්වෙන කාව්‍යාලංකාරය වන්නේ,

1. ස්වභාවෝක්ති අලංකාරයයි. 2. උත්ප්‍රේක්ෂාලංකාරයයි.

3. උපමාලංකාරයයි. 4. රූපකාලංකාරයයි.

12. ″දරුවෝ″ යන පදයෙහි නාම ප්‍රකෘතිය වන්නේ,

1.දැරියෝ යන්නයි. 2. දරුවා යන්නයි. 3. දැරිය යන්නයි. 4. දරු යන්නයි.

13. අපි වියතුන්ට තුති පුදමු. මෙහි වියතුන්ට යන්න,

1. අවධි විභක්ති පදයකි. 2. ආධාර විභක්ති පදයකි.

3. සම්ප්‍රදාන විභක්ති පදයකි. 4. කර්ම විභක්ති පදයකි.

❖ 14 සිට 16 තෙක් ප්‍රශ්නවල ඉරි ඇදි කොටසේ අර්ථය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න

14. සාහිත්‍ය පොත පරිශීලනය තුළින් උසස් රසවින්දන ශක්තියක් උරුම කර ගත හැකිය.

1. ඇසුරු කිරීම 2. ආස්වාදය 3. රැස් කිරීම 4. පරිභෝජනය

15. ඇගේ රංගනය චිත්තාකර්ෂණීය දර්ශනයක් විය.

1. නෙත් ඇදගන්නා 2. කන් පිනවන 3. සිත් ඇදගන්නා 4. ජීවිතය සතුටු කරවන

16. ආරාධිත අමුත්තාගේ සම්ප්‍රාප්තිය සමග සියල්ලෝම අසුන්වලින් නැගී සිටියහ.

1. පිටවීම 2. පැමිණීම 3. සංචාරය 4. ආරාධනය

17. පහත සඳහන් පද අයත්වන ව්‍යාකරණ ප්‍රවර්ගය කුමක්ද?

මෙන්, සිට, එම්බල, පිණිස, ය

1. තද්ධිත 2. කෘදන්ත 3. උපසර්ග 4. නිපාත

18. මුලින් දී ඇති පදයට සමානාර්ථවත් පද පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.

1. හිරු - චන්ද්‍ර, සිසි, දිනමිණ, නුබමිණ 2. ගජ - හස්ති, ඇත්, මිග, අස්

3. රජ - නිරිඳු, තරිඳු, මිගිඳු, භූපති 4. නෙළුම් - පද්ම, සරෝජ, අරවින්ද, සියපත්

19. මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථයක් නොදෙන පදය ඇතුළත් වරණය තෝරන්න.

1. ආයාත - නිර්යාත 2. සුනීත - විනීත

3. පුරෝගාමී - අධෝගාමී 4. දුෂ්කර - සුකර

20. නිපාත පදයක් අන්තර්ගත නොවන වරණය තෝරන්න.

1. මෙන්, සේ, වැනි, බඳු 2. ල, ලු, න, නො

3. තෙක්, දක්වා, අනේ, අහෝ 4 අයුරු, එම්බල, එම්බා, මිතුරුනි

21. උපසර්ග පදයක් යෙදී නැති වරණය තෝරන්න.

1. ප්‍රතිඵල, ප්‍රාතිහාර්ය, ප්‍රවේග, ප්‍රධාන 2. උපදේශ, උපචාර, උපනායක, නිරෝගී

3. විදේශ, පබල, වියෝග, විවාද 4. සංවර්ධන, සංරක්ෂණ, සංවේදනා, ඉමිහිරි

22. තද්ධිත පද පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

1. වාසනාවන්ත, නැටිලි, කෙත්වත්, මාවත් 2. සෙල්මුවා, කනකමය, සාමය, දාරුමය

3. වරලස, බුද්ධිමත්, ශ්‍රේෂ්ඨතම, උදාරතම 4. සුමිහිරි, දුර්ජන, නිර්ධන, ලියවිලි

23. කෘදන්ත පද පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

1. ගයන, වයන, මුදුනත, සවනත, 2. නටන්නා, නැටුම්, ලියුම්, බැලුම්

3. රැඟුම්, ඉසුරුමත්, රසවත්, මුහුණත් 4. ගුණවත්, බලවත්, බලන, රකින

24. 'ගොවියා' යන පදය අයත් වනුයේ,

1. ස්වර සන්ධියටය　　2. පූර්වස්වර ලෝප සන්ධියටය

3. ආගම සන්ධියටය　　4. ගාත්‍රාදේශ සන්ධියටය

25. වැරදි ලෙස සන්ධි කළ පදය අයත් වරණය තෝරන්න.

1. දකුණු + අත - දකුණත　　2. ගුරු + උතුමා - ගුරුතුමා

3. දරු + එක් - දරුවෙක්　　4. ප්‍රති + උපකාර - ප්‍රතුපාකාර

26. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. ය, ර, ල, ව යනු අර්ධ ස්වර නොවේ.

2. රේඵය වෙනුවට රකාරාංශය යෙදිය හැකිය.

3.ජ් + ඤ් + අ යන අක්ෂර සංයෝජනයෙන් "ඥ" අක්ෂරය නිර්මාණය වේ.

4. ඍ, ඎ, යනු ව්‍යංජන අක්ෂර දෙකකි.

❖ 27 -28 ප්‍රශ්න සඳහා වඩාත්ම ගැලපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

27. විශාල වැරදි තිබෙද්දී සුලු වැරදිවලට පිළියම් කිරීම.

1. බොරදියේ මාළු බානවා වගේ　　2. අලි යන කපොලු තිබියදී කුඹී යන තව් වහන්නා වගේ

3. අතු කඩා මොර කනවා වගේ　　4. කපුරු දැවුණු තැන අළුත් නැතිලු

28. කෙනෙකුගෙන් උපකාර ලබා වෙනත් අයෙකු පැසසීම.

1.බල්ලන්ට ලෙලි පොල් දීම　　2. එපා වාහෙට හොඳි බෙදීම

3. ආතාට අටුකොස් දීම　　4. ගඟෙන් දිය බී මුහුදට ආ වැඩීම

❖ 29 – 30 ප්‍රශ්න සඳහා නිවැරදි අර්ථ සහිත පද යුගලය තෝරන්න

29. A - දීපවාලී - ආලෝක පේළිය　　B - ආරාමය - විවේකාගාරය

C - පුලිනතලා - වැව් පිටිය　　D - ඉතා තියුණු - සුනිශිත

1. A හා D　　2. A හා B　　3. A හා C　　4. B හා D

30. A - පුන්නච්චා - නිදාගන්නවා　　B - කොකිස් - කිරිඅල

C - අළුහන් වැඩීම - අළු ගැනීම　　D - දියදොස් - පැණි කොමඩු

1. A හා D　　2. A හා C　　3. B හා C　　4. B හා D

❖ 31 – 33 දක්වා ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.

31. 1. මෙම පන්තියේ ගුරුවරුන් නැත.　　2. කුකුළෝ හඬද්දී ඔහු හේනට ගියේය.

3. සාහිත්‍ය සමුළුවේදී සියලුම විද්වත්හු අප ඇමතුහ.　　4. තාරකා පෙළ අහසේ බබළති.

32. 1. පොත් කියවන්නෝ ලොවම දිනන්නෝය.　　2. බල්ලෝ විසින් හාවෝ ඇල්ලෙති.

3. ආරාධිත අමුත්තා විසින් ප්‍රදර්ශනය විවෘත කරයි.　　4. සියලු සත්ත්වයෝ නිදුක් වේවා.

33. 1. ගොවියන් විසින් අටුකොටු පුරවති.　　2. ගොවියන් අටුකොටු පුරවාවි.

3. කාන්තාවක් පාරේ ගමන් කළේය.　　4. අපි වැඩකරතියි දෙමව්පියෝ නොදනිති.

❖ හිස්තැනට සුදුසු අනුපිළිවෙල තෝරන්න.

34. 1. ........................................ භාණ්ඩ සගවති"යි පාරිභෝගිකයෝ මැසිවිලි නගති.

2. .................... .................... විසින් සේවකයෝ අගය කරනු ලබති.

3. ඔබ එතොත් .......................... ද එමි.

4. අම්මා ද තාත්තා ද මම ද ගමට .................................

| | | | |
|---|---|---|---|
| A - වෙළෙන්දන් | B - වෙළෙන්දෝ | C - පාලකයන් | D - පාලකයෝ |
| E - මා | F - මම | G - යමි | H - යමු |
| 1. A B C D | 2. B A C D | 3. B C D G | 4. A C F H |

35. ශේක්ස්පියර්ගේ නාට්‍යයක් වන්නේ,

1. රෝමියෝ සහ ජුලියට් 2. හුණුවටයේ කථාව 3. මහාසාර 4. තලමල පිපිලා

36. සඳවා සුදු වැලි පිවිතුරු

බඳවා රන් දද පියකරු

සිටුවා දොර දොර රඹතුරු

තබවා පුන් කුඹු විසිතුරු

මෙම කවිය ඇතුලත් කෘතිය වන්නේ,

1. කව් සිළුමිණ ය. 2. මුව දෙව් දා වතය. 3. ගුත්තිල කාව්‍යය ය. 4. කාව්‍යශේඛරය ය.

❖ 37 – 39 දක්වා ප්‍රශ්නවල මුලින් ඉදිරිපත් කර ඇති පාඨ සඳහා වඩාත් සමීප අර්ථ දෙන වරණය තෝරන්න.

37. රටක යටිතල පහසුකම්වල සංවර්ධනයක් සිදු වී තිබීම එරට සමෘද්ධිමත්භාවයේ එක් සංකේතයකි.

1. රටක් සංවර්ධනය වන්නේ එරට යටිතල පහසුකම් තිබුණොත් පමණි.

2. රටක සංවර්ධනයේ ප්‍රධාන ලක්ෂණය වනුයේ යටිතල පහසුකම් දියුණු වී තිබීමය.

3. යටිතල පහසුකම් දියුණු කිරීමෙන් රටක් සංවර්ධනය කළ හැකිය.

4. රටක යටිතල පහසුකම් දියුණු වී තිබීම එරට සංවර්ධනයේ ලක්ෂණයකි.

38. නවීන තාක්ෂණික මෙවලම් මිනිසාගේ යහපත වෙනුවෙන් යොදා ගත යුතු වුවත් වර්තමානයේ එය මිනිසාගේ යහපතට වඩා අයහපතට හේතු වී ඇති බව පෙනේ.

1. මිනිසාගේ යහපත වෙනුවෙන් නවීන තාක්ෂණික මෙවලම් යොදාගත යුතු වුවත්, අද වන විට එය මිනිසාට අයහපත උදාකරදී ඇත.

2. නවීන තාක්ෂණික මෙවලම් භාවිතය මිනිසාගේ යහපත සඳහා විය යුතුය.

3. නවීන තාක්ෂණික මෙවලම් මිනිසාට අයහපත උදාකරයි

4. නවීන තාක්ෂණික මෙවලම් මිනිසාගේ කාර්යයන් පහසු කිරීමට වඩා විවිධ අපහසුතා ඇති කිරීමට හේතු වී ඇත.

39. වැව මුල් කරගත් ජලාශ්‍රයකට විපතක් සිදු වේ නම් එය රටවැසි සියල්ලන්ටම සිදුවන විපතක් වශයෙන් දුරාතීතයේ සිටම සැලකිණි.

1. ජල සම්පතට සිදුවන විපත රටටද සිදුවන විපතක් ලෙස අතීතයේ දී සැලකිණි.

2. වැවකට සිදුවන විපතක් රට වැසියන්ට සිදුවන විපතක් ලෙස සලකන්නට අතීත වැසියෝ පුරුදු වූහ.

3. වැව මූලික කරගත් ජල සම්පතට විපත් සිදුවීම රටවාසීන්ට සිදුවූ විපතක් වශයෙන් අතීතයේ පටන්ම

4. වැව මූලික කරගත් ජල සම්පතට හානි සිදු වීම රටටම වූ හානියක් බව අතීත කාලයේදී සැලකිනි.

40. විරාම ලක්ෂණ නිවැරදිව යෙදී ඇති වරණය තෝරන්න.

1. ටොනාඩෝ ? ඒ මොකක්ද මාමේ..

2. " මේ ගොනා අනිනවද." ඔහු කම්කරුවන්ගෙන් ඇසීය.

3. " මම ගෙදර යමි " යි හෙතෙම කීවේය.

4. මේ කරුණු ඔහුගේ ග්‍රන්ථයේ 210 / 310 පිටුවල සඳහන්ය.

මහමෙව්නා අධ්‍යාපන කලාපය

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone
மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்
මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය

# පෙර'ඹරට සවියක් ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන

| සිංහල භාෂාව හා සාහිත්‍යය II | 11 ශ්‍රේණිය | කාලය : පැය 02 යි |
|---|---|---|

❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

**01. (i) සිට (x) තෙක් ඇති සියලුම අනුකොටස්වලට උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) සිංහල අක්ෂර මාලාවෙහි ඇතුළත් 'ත' වර්ගයේ අකුරු දෙකක්ද, විසර්ගය යෙදූ පදයන් ද ලියන්න.

(අ) .......................................... (ආ) ..........................................

(ii) පහත දැක්වෙන වචන දෙක යොදා අර්ථවත් වාක්‍ය දෙකක් ලියන්න.

(අ) ලවණ (ආ) ලවන

(iii) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් තද්ධිත හා කෘදන්ත පදය නම් කරන්න.

''සිඟිත්තන්ගේ ගී නැටුම් බලා අපි සතුටු වුණෙමු.''

(අ) .......................................... (ආ) ..........................................

(iv) ''නටයි'' යන ක්‍රියාපදයේ ධාතු ප්‍රකෘතියේ ඇසුරෙන් පහත ක්‍රියා පදවලට නිදසුන් ලියන්න.

(අ) මිශ්‍ර ක්‍රියාව ..........................................

(ආ) අසම්භාව්‍ය ක්‍රියාව ..........................................

(v) පහත දැක්වෙන අදහස්වලට ගැළපෙන තනි පදය ලියන්න.

(අ) හේතු අනුව යමක් සිතා ගැනීම ..........................................

(ආ) අලුතින් යමක් සෙවීම ..........................................

(vi) (අ) සහ (ආ) කොටසේ ඇති කර්තෘ කාරක වාක්‍ය දෙක කර්ම කාරකයට හරවා ලියන්න.

(අ) වෛද්‍යවරු රෝගීන් සුවපත් කරති. (ආ) අම්මා අප නැළවූවාය.

(vii) පහත දැක්වෙන ප්‍රාදේශීය යෙදුම් සඳහා වන පොදු වහර ලියන්න.

(අ) බක්කම්මා ..........................................

(ආ) හේමලයා ..........................................

(viii) පහත සඳහන් පද සන්ධි කොට සන්ධි වර්ගය නම් කරන්න.

(අ) උදර + ආබාධ (ආ) ඉන් + ඉක්බිති

(ix) පහත දැක්වෙන වාක්‍ය සදොස් නම් ඒවා නිදොස් කර නැවත ලියන්න.

(අ) ඕ තොමෝ පන්සලට ගොස් මල් පහන් පූජා කරති.

(ආ) ක්‍රීඩකයෝ තරඟය දිනති' යි පුහුණුකරුවෝ සිතූහ.

(x) පහත දැක්වෙන පද අයත් සමාස වර්ගය දක්වන්න.

(අ) දස පනත - ආ) කිරිබත් - (ල. 2x10 = 20)

මතුගම අධ්‍යාපන කලාපය

**02. පහත දැක්වෙන අ, ආ, ඇ, ඉ, ඊ යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250 ට නොඅඩු වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.**

(අ) ස්වභාව සෞන්දර්යයෙන් අනූන අතීත උරුම රැසකට හිමිකම් කියන ශ්‍රී ලංකාව සුන්දර දිවයිනකි. රට විදේශ ආධිපත්‍යයට ලක් වූ විටදීත්, නිදහස ලැබීමෙන් පසුවත් තම ජන්ම භූමියේ අගය, ගෞරවාන්විත හැඟීම්වලින් යුතුව මුදා හිරීමට දේශාභිමානී ගීත සාහිත්‍යයක් බිහි විය. ඒවා බොහොමයක් සාහිත්‍යමය ගුණයෙන් ද සුපෝෂිත වී ඇත. නමුත් වර්තමානයේ බිහිවන බොහෝ ගී නිර්මාණ දේශාභිමානී හැඟීම් ජනනය කරනු තබා සාහිත්‍යමය ගුණයෙන් ද විනිර්මුක්ත වී ඇති බව පෙනේ.

(ආ) අතීත සිංහලයා පරිභෝජනයට ගත්තේ වස විසෙන් තොර දේශීය ආහාර වර්ගයි. වර්තමානයේ පවතින අධික කාර්ය බහුලත්වය නිසාම පුද්ගලයා තෙල්, සීනි, තිරිඟු පිටි මෙන්ම රසායනික ද්‍රව්‍ය හා වර්ණකාරක අඩංගු ක්ෂණික ආහාර පරිභෝජනයට හුරු වී තිබේ. මෙහි වඩාත්ම අහිතකර තත්ත්වය වන්නේ කුඩා පාසල් සිසුවා පවා සාම්ප්‍රදායික ගුණදායී ආහාරපාන කෙරෙහි විරෝධාකල්පයක් දැරීමයි. එබැවින් අනාගත පරපුර කෙරෙහි බලවත් ව්‍යසනයකට අත වනන මෙකී වාතාවරණයට කඩිනම් විසඳුම් සෙවිය යුතුය. නීරෝගී පරපුරක් වෙනුවෙන් අපට මෙන්ම රජයට ද කළ හැකි දේ බොහෝය.

(ඇ) කලින් කල හිස ඔසවන විවිධ රෝග වාහක බලවේග නිසා බෝවන රෝග සමාජය තුළ ව්‍යාප්ත වෙමින් පවතී. අදඅ ප මුහුණ දී සිටින්නේ ද එබඳු සමාජ වාතාවරණයකටය. කොරෝනා වසංගතය ලොවම වෙළාගෙන ඇත. මෙම වෛරසයෙන් බේරීමට නම් සමාජ දුරස්ථභාවය අත්‍යවශ්‍ය වේ. එමෙන්ම බොහෝ සෞඛ්‍ය පුරුදු ද අනුගමනය කළ යුතුය. මෙහිදී හුදෙකලා වීම යන සංකල්පය තුළ පුද්ගලයාට දැනෙන තනිකම, පීඩනය හා මානසික ව්‍යාකූලතා බොහෝය. සාමාජීය සත්ත්වයෙකු ලෙස මිනිසාට එය තදින්ම බලපායි. වෙන්ව සුරැකෙමින් එක්ව ගොඩ යාමට අප සියලු දෙනා කටයුතු කළ යුතුව ඇත.

(ඉ) සාහිත්‍ය රස වින්දනය වූ කලී මිනිසාට තෘප්තිමත් ලෝකයකට පාර කියන්නා වූ සංකල්පයකි. වර්තමානයේ විවිධ මානසික ආතතිවලින් පෙළෙන ලෝකයාට සැනසිල්ල එන්නත් කරනුයේ සාහිත්‍ය රස වින්දනයෙනි. එකිනෙකා පරයා නැගෙන තරඟකාරීත්වය හමුවේ අනාගත පරපුර මනසින් අතරමං වී සිටිති. එයට ප්‍රධාන හේතුව සාහිත්‍ය කෙරෙන් මිනිසා දුරස් වීමයි. එබැවින් අනුන් කෙරෙහි සංවේදී මනසකින් යුත් දරුවෙකු බිහි කිරීමට නම් විෂය මාලාව තුළ සාහිත්‍ය විෂයට නිසි තැනක් ලබා දිය යුතුය. සාහිත්‍ය මිනිසාගේ මනස තුළ රෝපණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු කාලය එළඹ ඇත.

(ඊ) තමා උපන් දේශය පිළිබඳ ඇල්ම දේශානුරාගය නමින් හැඳින්වේ. දේශානුරාගය බලෙන් සිත් තුළට කාවැද්දිය නොහැක. ඒ සඳහා අතීතයේ දී නොයෙකුත් නිර්මාණ බිහි කරන්නට පැරණි සිංහලයා උත්සුක වූයේ ය. දෙදහස් පන්සිය වසරක අභිමානවත් ඉතිහාසයක් ගැන අපට කතා කරන්නට හැකි වී තිබෙන්නේ එම නිසාය. අතීත මුතුන් මිත්තන් අපට දුන් දායාදවල වටිනාකම හඳුනාගෙන අනාගතයට තව තවත් නිර්මාණ දායාද කිරීමට අප වග බලා ගත යුතුය.

**03. පහත දැක්වෙන පාඨය වචන 65 - 75 වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.**

ලංකාව විදේශ ආධිපත්‍යයට හසුවීමට පෙර මුළු රටේම අධ්‍යාපනය පැවතියේ ඒ ඒ ගම්වල පැවති පන්සල් ආශ්‍රිතවය. පන්සල් මඟින් මූලික අධ්‍යාපනයක් ලැබීමෙන් පසු උසස් අධ්‍යාපනය ලබා දීම සඳහා සෑම පෙදෙසකටම ගම්මාන කිහිපයකට එක් පිරිවෙනක් බැගින් පිහිටුවා තිබුණේය. කෝට්ටේ හෙවත් ජයවර්ධනපුර සමය වන විට ලංකාවේ පැවති ඉතා උසස් පිරිවෙන් කිහිපයක් ගැන ලංකා ඉතිහාසයෙහි සඳහන්ය. එහෙත් පහත රට පරංගීන් සතු වීමෙන් පසු මේ පිරිවෙන් සියල්ලම අභාවයට පත් වූ බව සැලකිය හැකිය. ඕලන්ද සමයේ ද පන්සල් අධ්‍යාපනයට කිසිම රුකුලක් නොලැබුණේය. ඉංග්‍රීසි ආණ්ඩුවට ද මුල් කාලයේ ක්‍රියා කළේ පන්සල් අධ්‍යාපනය හා පිරිවෙන් අධ්‍යාපනය නැති කර දැමීමටය.

එහෙත් භික්ෂූන් වහන්සේලාගෙත්, බෞද්ධ මහ ජනතාවගේත් උනන්දුව නිසා ආරම්භ කරන ලද පිරිවෙන් කිහිපයකටම යටත් විජිත ආණ්ඩු විසින් ආධාර දීමට පටන් ගන්නා ලදී. එහෙත් එය පුංචි අම්මාගේ සැලකිල්ලට වඩා වැඩි වෙනසක් නොවූ බව කිව හැකිය. රට නිදහස් වීමෙන් පසු ද පසුගිය ආණුඩු පිරිවෙන් අධ්‍යාපනයට දිය යුතු තැන නුදුන් බව රහසක් නොවේ. මහජන ආණ්ඩුව විසින් පිරිවෙන් දෙකක් විශ්ව විද්‍යාල තත්ත්වයට පත් කරන අතර, අනෙක් පිරිවෙන් වල තත්ත්වය දියුණු කිරීම සඳහා දැනට දෙනු ලබන ආධාර මෙන් දෙගුණයක් ආධාර දීමට තීරණය කිරීම ඉතා වැදගත් ලෙස සැලකිය යුතුය. මේ වනතුරු පිරිවෙන් සම්බන්ධයෙන් පැවතෙන මූලික හා උපරිම යන භේදය ආධාර දීමේදී මින් මතුවට නොසැලකීමට ගත් තීරණය ද මහජන ප්‍රසාදයට හේතුවන බව ප්‍රකාශ කරමු. (ලකුණු 10)

**04. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

මනුෂ්‍යයා ස්වභාවයෙන්ම තිරිසන් ගති ඇති සත්ත්වයෙකැයි ද, ආගමික ධර්මයන්ගේ මාර්ගයෙන් ඔහු ශිෂ්ට වන්නේ යැයි ද කියනු ලැබේ. මනුෂ්‍යයා ශිෂ්ට කරවීමේ ආගමික ධර්ම ඇති වී අවුරුදු දෙදහසකටත් වැඩි යැයි කිව යුතුය. එහෙත් මේ සියල්ලන්ගෙන් හෝ එකකින් හෝ ප්‍රමාණවත් අන්දමින් මනුෂ්‍යයා ශිෂ්ටයකු කිරීම සිදු නොවූ බව දැන් පවතින ලෝක තත්ත්වයෙන් වටහා ගත හැකිය. ආගමික ධර්මයෙනුත්, ශිෂ්ටාචාරයෙනුත්, ශාස්ත්‍ර විද්‍යාවනුත් නිර්මාණය කරන්නේ මනුෂ්‍යයෝම ය. ඒවා ක්‍රෑර ලෙස විනාශ කර දමන්නෝ ද මනුෂ්‍යයෝම ය. ඉතිහාසය පටන් ගත් තැන සිට මනුෂ්‍ය ඥානයෙන් නිර්මාණය වූ උත්කෘෂ්ට ධර්මයෙන් ද, ශාස්ත්‍ර විද්‍යාවන් ද නොනැසී පැවතුණා නම් අද ලෝකය කාටත් සැපවත් ව ජීවත් විය හැකි ප්‍රසන්න ස්ථානයක් වන්නට තිබුණේ ය. එහෙත් මනුෂ්‍ය ගතියේ දුෂ්ටකම නිසා ඒ සියල්ල විනාශ වී ගියේ ය.

(i) අද ලෝකය මනුෂ්‍යයාට ප්‍රසන්න ස්ථානයක් නොවීමට හේතු කවරේද?

(ii) මනුෂ්‍යයා ශිෂ්ට කළ හැකි ධර්ම ඇති වී අවුරුදු කීයක් පමණ ගත වී තිබේ ද?

(iii) දැන් ලෝක තත්වය අනුව මනුෂයා ගේ ශිෂ්ට වීම පිළිබඳව කුමක් අවබෝධවේ ද?

(iv) මනුෂ්‍ය ගතියේ දුෂ්ටකම් නිසා සිදු වූයේ කුමක්ද?

(v) මනුෂ්‍යයා විසින් නිර්මාණය කර ඇත්තේ මොනවාද?

05. (අ) මොනරාගල, හුලංදා ඔය ගම්මානයේ සිට තම අවශ්‍යතා ඉටුකර ගැනීමට නගරයට පැමිණෙන ජනතාව පොදු ප්‍රවාහන පහසුකම් නොමැති වීම නිසා මහත් දුෂ්කරතාවකට මුහුණ දී සිටිති. දෛනිකව මේ ප්‍රදේශයේ සිට පාසල් යන දරුවන් සැලකිය යුතු පිරිසක් නගරයට පයින් එන අතර, ගම් වැසියන්ට තම අස්වැන්න අලෙවි කර ගැනීම සඳහාත් එය දැඩි බාධාවක් බවට පත් වී ඇත. මේ පිළිබඳව අවධානය යොමු කොට ගම්මානයේ සිට නගරයට ධාවනය කිරීම සඳහා බස් රථයක් ලබා දෙන ලෙස ඉල්ලමින් මොණරාගල ඩිපෝවේ, ඩිපෝ අධිකාරිවරයාට යැවෙන රාජකාරී ලිපිය ලියන්න. ඔබ හුලංදාඔය ප්‍රදේශයේ ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් ජයලත් සමන්ත යැයි සිතන්න.

(ලකුණු 15)

නැතහොත්

(ආ) නෙළුම්දෙණිය ප්‍රතිභා මහා විද්‍යාලය මගින් 2022.05.10 දින සාහිත්‍ය උළෙලක් සංවිධානය කරන ලදී. ''ප්‍රතිභා ප්‍රභා'' නමින් නම් කර තිබූ එම උළෙල සඳහා ප්‍රධාන ආරාධිතයා වූයේ කොළඹ විශ්ව විද්‍යාලයේ මහාචාර්ය සමන්ත හේරත් මහතාය. එතුමා ගීතය සමාජ ප්‍රගමනය නමින් කළ දේශනය බොහෝ දෙනාගේ පැසසුමට ලක්විය. නැටුම්, ගැයුම්, වැයුම් වලින් හැඩ ගැන්වූ කලා උළෙලෙහි නර්තන නිර්මාණය සිදුකර තිබුණේ ප්‍රවීණ රංගවේදී ප්‍රදීප් නාරංගොඩයි. විද්‍යාලයෙහි ප්‍රතිභාපූර්ණ සිසුන් උදෙසා ත්‍යාග ප්‍රදානය සිදු කරන ලද්දේ නෙළුම්දෙණිය ප්‍රාදේශීය ලේකම්තුමා විසිනි. ඔබ විජය පුවත්පතේ ප්‍රාදේශීය වාර්තාකරු නිමින සංකල්ප යැයි සිතා මෙම උත්සවය පිළිබඳ වාර්තාවක් සකස් කරන්න.

(වචන 100 ක් පමණ සෑහේ) (ලකුණු 15)

මතුගම අධ්‍යාපන කලාපය

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone
மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்
මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# පෙර'ඹරට සවියක් ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන

| සිංහල භාෂාව හා සාහිත්‍යය III | 11 ශ්‍රේණිය | කාලය : පැය 02 යි |
|---|---|---|

- ❖ වැදගත් - උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.
- ❖ 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්න වලින් එකකටත් උත්තර සපයන්න.
- ❖ මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

01. :ස* සිට :ℴ* තෙක් ඇති සියලුම අනුකොටස්වලට උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) ''මේ රජ්ජුරුවණට හා මුත් අනෙක් පිළිසරණක් නැති''

(අ) මෙහි ''මේ රජ්ජුරුවන්'' යනුවෙන් හඳුන්වන්නේ කුමන රජතුමාද?

(ආ) ඉහත ප්‍රකාශය කිරීමට මුල් වූ හේතුව කුමක්ද?

(ii) ''මහරජ, එක් සොරකු සඳහා තා ගිය මනා නොවෙයි''

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් කතාවේ කතුවරයා නම් කරන්න.

(ආ) මෙහි ''සොරෙකු'' යනුවෙන් අදහස් කරන්නේ කවරෙක්ද?

(iii) (අ) ''බැද්දේගම'' නමින් සිංහලයට අනුවර්තනය කරන ලද මුල් නවකතාව කුමක්ද?

(ආ) එහි කතුවරයා නම් කරන්න.

(iv) හිරිමල් සිනා රැළි පෙණ පිඬු මිහිරි ........................ තම
ගල්පරවලම හැපි හැපි බිහිකරමි ........................ මම

(අ) ඉහත පද්‍යයේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

(ආ) මෙම පද්‍ය පන්තියේ රචනා වූ සාහිත්‍ය යුගය නම් කරන්න.

(v) ''දෑසේ කඳුළැලි පිස දා බලනෙමි - හෙට හිරු එළියට වඩින දිනේ
ණය නැති බිය නැති නිවහල් යුගයක - පුංචි පුතා රජ කරනු පෙනේ''

(අ) මේ පැදිය උපුටා ගත් කවි පෙළේ රචකයා කවරෙක්ද?

(ආ) මෙහි දැක්වෙන පරිදි කවියාගේ අපේක්ෂාව කුමක්ද?

(vi) වේ රුදු දෝසා කළ මේ ........................ දේ
මා පුතු නො තකා ........................ විපාකේ

(අ) මෙහි රුදු දෝසයක් යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

(ආ) මෙහි මා පුතු යනුවෙන් හඳුන්වනු ලබන තැනැත්තාගේ නම ලියන්න.

(vii) (අ) අමාවතුර ග්‍රන්ථය සඳහා පාදක වූ බුදු ගුණය කුමක්ද?

(ආ) උග්ගසේන නම් සිටු පුත්හුගේ වස්තුව ඇතුළත් වන මුල් කෘතිය සඳහන් කරන්න.

(viii) (අ) හංස සන්දේශය රචනා කළ කතුවරයා නම් කරන්න.

(ආ) එම සන්දේශය රචනා වූ යුගයේ රජකම් කළ සාහිත්‍ය ප්‍රබෝධය ට පිටිවහලක් වූ රජතුමා නම් කරන්න.

(ix) මීට කලින් නේද මේක ගෙනත් දෙන්න තිවුනේ? මටත් ඕක ඕන කෙරුව නම් එහෙම?

(අ) මේ කවුරුන් විසින් කරන ලද්දක්ද?

(ආ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළ අයගෙන් සිදුවූ වරද කුමක්ද?

(x) තාත්තා එනවා දැකලා මට බන්නවන්න කතා කළා නේ ද?

(අ) මේ පාඨය ඇතුළත් සාහිත්‍ය නිර්මාණයේ රචකයා කවරෙක්ද?

ආ) ඔහු ලියූ වෙනත් කෙටි කතා සංග්‍රහයක් නම් කරන්න. (ල. 2o10¸ 20)

02. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරු ලියන්න.

(i) සතර දෙනෙකු කෙරෙහි විස්වාස් නැති සොර පෙරැ මා සබඳව' යි විස්වාස් නොකොට යුත්තේ යැ තමා පළමු අතොට හුන් කොළ' මා පෙරැ වළඳ ගත්තෙ යැ' යි විස්වාස් නොකොට යුත්තේ යැ. රජතුමා හා සබඳහයි විස්වස් නොකොට යුත්තේ යැ ස්ත්‍රී මට වශ්‍ය යැ' යි විස්වස් නො ද කටයුත්ත යැකී යැ.

(අ) මේ පාඨයේ දැක්වෙන පරිදි විශ්වාස නොකළ යුතු දෙදෙනෙකු නම් කරන්න.

(ආ) අංකිත පදවලට අර්ථ සපයන්න.

(ii) මා පියා හැර දමා
යන්නේ අප කෙලෙස දෝ
වලට ගොස් විඩා වී
පැමිණි විට නැත කෙනෙක්
අහර පිස දෙන්නටා
හුදෙකලා මේ ලෙනේ
ඉන්න ඔහු කෙලෙස දෝ

(අ) මේ ගීයෙන් සිංහ සීවලිගේ චරිතයෙහි කෙබඳු ලක්ෂණ ප්‍රකාශ වේ ද?

(ආ) මෙහි දැක්වෙන පරිදි පියාට මුහුණ දීමට සිදු වන දුෂ්කරතා දෙකක් සඳහන් කරන්න.

(iii) වර වෙණ නද අසමින් සිත සතොසිනි
සර හැර සියොතුන් සියපත් විදිමිනි
පුරඹර වසමින් සිටි රඟ කුම් වැනි
සුර සෙනගට සුරසුන් පැන වූ වැනි

(අ) ඉහත කවියේ විස්තර වන්නේ කවුරුන් ගැනද?

(ආ) ඔවුන් එලෙස සිටීමට හේතුව කුමක්ද?

(iv) හිරපල්ලා තම කතාවෙන් බලාපොරොත්තු වූයේ හිස අත බදාගෙන කෑගසන ගැහැනිකගේ විලාපයකි. එහෙත් පුංචි මැණිකා නිශ්ශබ්දවම එතැනින් ගොස් නැවතත් බිත්තිය අද්දර ඇත තියා ගැනීම ඔහුගේ මවිතයට හේතු විය. සාමාන්‍ය අන්දමට ශෝකය ප්‍රකාශ කිරීමට ඇගේ සිතට වැදුණු පහර තද වැඩිය.

(අ) මෙහි හිරපල්ලා යනුවෙන් හඳුන්වා ඇත්තේ කවරෙක්ද?

(ආ) ඇගේ සිතට වැදුණු පහර තද වැඩිය යන්නෙන් අදහස් කර ඇත්තේ කුමක්ද?

(v) කොල <u>පිවටු</u> දුෂ්ට අධර්මිෂ්ඨ වූ <u>නිකෘෂ්ට</u> අනාචාර ස්වරූප ඇති අවලක්සණ වූ අඥාන බමුණු මහල්ල. තෝ ධර්ම යුද්ධය කෙරෙමි' යි කියා ගොසින් තට මුනුබුරු තරමටත් නැති ඉතා බාල තැනැත්තන් වැඳපීය.

(අ) මේ පාඨය හා සම්බන්ධ සිද්ධිය කෙටියෙන් ලියන්න.

(ආ) අංකිත පදවලට අර්ථ සපයන්න. (ල. 04x05 = 20)

❖ 03, 04 යන ප්‍රශ්න සඳහා වචන 200 ක් පමණ තිබීම සෑහේ.

03. (i) ජනකවියේ ඇති අව්‍යාජත්වය මෙන් ම,

(ii) කාව්‍ය රසවත් කිරීම කාව්‍යාලංකාර යොදාගෙන ඇති ආකාරය කුරහන් ඉසිමුව කළුවර බලාලා පද්‍ය පන්තියෙන් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

(i) අහිංසක දරුණු මිනිමරුවෙකු වූයේත්

(ii) දරුණු මිනීමරුවෙකු ඉතා යහපත් වැඩදායී පුද්ගලයෙකු වූයේත් සමාජයේ පුද්ගල ක්‍රියාකාරකම් හේතුවෙනි. අංගුලිමාල දමනය ඇසුරෙන් එක් කොටසකට උදාහරණ දෙක බැගින් දක්වමින් ඉහත කියමන පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

04. උම්මග්ග ජාතකයෙන් මහෞෂධ පඬිතුමාගේ,

(i) ස්ථානෝචිත ප්‍රඥාවත්

(ii) සානුකම්පිත භාවයත්

සිත් ගන්නා පරිදි ඉදිරිපත් වෙයි. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.

නැතහොත්

(i) හැඟීම්වලට වහල් වීම,

(ii) අභියෝග ජය ගැනීම,

යන කරුණු උග්ගසේන නම් සිටු පුත්හුගේ කථා වස්තුවෙන් ඉස්මතු කොට දැක්වීමට කතුවරයා සමත් වූ ආකාරය එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න. (ල. 15)

❖ 05, 06, 07 ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර ලියන්න. (වදන ගණන 150 ක් පමණ සෑහේ)

05. ''සුප්පා දේවිය සිය සැමියා කෙරෙහි දැඩි ආදරයක් ඇතත් ඔහු අතහැර දමා යන්නේ දරුවන්ගේ සුබ සිද්ධිය වෙනුවෙනි.'' ලෙන අතහැර යාම පාඩමින් උදාහරණ තුනක් දක්වමින් ඉහත කියමන පැහැදිලි කරන්න. (ල. 10)

06. මාර්ග වර්ණනාවේ දී සැළලිහිණි සන්දේශ කතුවරයා කාව්‍යෝපක්‍රම භාවිත කර ඇති ආකාරය මඟ විසිතුරු පාඩමින් උදාහරණ තුනක් දක්වමින් විමසන්න. (ල. 10)

07. කෙටිකතාවක සාර්ථකත්වයට එහි භාෂාව වැදගත් වෙයි. අපට වැසිකිළියක් කෙටි කතාව ඇසුරෙන් නිදසුන් තුනක් දෙමින් විමසන්න. (ල. 10)

මතුගම අධ්‍යාපන කලාපය

අවසාන වාර පරීක්ෂණය

සිංහල භාෂාව හා සාහිත්‍ය - 1

**11 ශ්‍රේණිය**

පිලිතුරු පත්‍රය

| | |
|---|---|
| 1-(1) | 21-(1) |
| 2-(2) | 22-(3) |
| 3-(3) | 23-(2) |
| 4-(3) | 24-(3) |
| 5-(3) | 25-(4) |
| 6-(1) | 26-(3) |
| 7-(2) | 27-(2) |
| 8-(2) | 28-(4) |
| 9-(3) | 29-(1) |
| 10-(3) | 30-(4) |
| 11-(4) | 31-(3) |
| 12-(4) | 32-(1) |
| 13-(3) | 33-(2) |
| 14-(1) | 34-(4) |
| 15-(3) | 35-(1) |
| 16-(2) | 36-(3) |
| 17-(4) | 37-(4) |
| 18-(4) | 38-(1) |
| 19-(2) | 39-(3) |
| 20-(4) | 40-(3) |

මතුගම අධ්‍යාපන කලාපය
දෙවන වාර ඇගයීම - 2021
සිංහල භාෂාව හා සාහිත්‍යය

| ශ්‍රේණිය - 11 | ප්‍රශ්න පත්‍රය - II |
|---|---|

පිළිතුරු පත්‍රය

(01) i. අ) ත, ථ, ද, ධ, න
ආ) අන්තඃපුරය, මනඃකල්පිත

ii. අ) ලුණු යන අර්ථය සහිත වාක්‍ය
ආ) තොල් යන අර්ථය සහිත වාක්‍ය

iii. අ) සිඟිති
ආ) නැටුම්

iv. අ) නටමින් / නටනටා
ආ) නටතොත් / නටද්දී

v. අ) අනුමානය
ආ) ගවේෂණය

vi. අ) වෛද්‍යවරුන් විසින් රෝගීහු සුවපත් කෙරෙති.

ආ) අම්මා විසින් අපි නැළවුණෙමු / නළවනු ලැබීමු.

vii. අ) ලොකු අම්මා
ආ) සෙවනැල්ල

viii. අ) උදරාබාධ - පූර්වස්වර ලෝප සන්ධිය

ආ) ඉනික්බිති - ස්වර සන්ධිය

ix. අ) ඕ තොමෝ පන්සලට ගොස් මල් පහන් පූජා කරයි / කරන්නීය.

ඌ තුමු පන්සලට ගොස් මල් පහන් පූජා කරති.

ආ) ක්‍රීඩකයන් තරගය දිනති යි පුහුණුකරුවෝ සිතූහ / සිතුවෝය.

x. අ) විශේෂණ සමාසය
ආ) විභක්ති සමාසය

(02) 01. සාරවත්භාවය, මාතෘකාවද ඇතුළුව - ල.08

02. සංවිධානය, නිර්මාණාත්මක බව, ස්වීයත්වය - ල.12

03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදීම - ල.05

ල.25

(03) සාරාංශකරණය

01. අන්තර්ගතය - ල.06

02. වචන ගණන - ල.02

03. ශිල්පීය දක්ෂතා - ල.02

ල.10

(04) (i) මනුෂ්‍යයා විසින් නිර්මාණය කරන ලද ආගමික ධර්මයන්, ශිෂ්ටාචාරයන්, ශාස්ත්‍ර විද්‍යාවන් ආදී සියල්ල මනුෂ්‍යයා විසින්ම විනාශ කර ගැනීම නිසා

(ii) දෙදහසකට වැඩිය.

(iii) ප්‍රමාණවත් පරිදි මනුෂ්‍යයා ශිෂ්ට වී නොමැති බව.

(iv) ලෝකය සැපවත්ව ජීවත් විය හැකි ප්‍රසන්න ස්ථානයක් වීමට තිබූ ඉඩකඩ නැති වී යාම.

(v) ආගමික ධර්මයන්, ශිෂ්ටාචාර, ශාස්ත්‍ර විද්‍යාවන්

ල. 2 x 5 = 10

(05) රාජකාරි ලිපිය හෝ පුවත්පත් වාර්තාව

01. ආකෘතිය සඳහා - ල.05

02. අන්තර්ගත - ල.07

03. ශිල්පීය දක්ෂතා සඳහා - ල.03

ල.15